පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: 35

අමාත්‍යාංශයේ නම : මූදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තාව සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 124(6) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 35

நிறுவனத்தின் பெயர் :

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசிய கொள்கைகள் அமைச்சு

பாராளுமன்றத்தின் வழிவகைகள் பற்றிய குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 124(6) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No : 35

Name of the Ministry :

Ministry of Finance, Economic Stabilization and National Policies.

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Ways and Means in terms of Standing Order No. 124(6)

ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවේ දෙවන වාර්තාව මත වූ නිර්දේශ සඳහා ක්‍රියාමාර්ග
(Recommendations on Committee of Ways and Means)

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
අංකය	නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ගය
5.3.1	බදු අනුපාත වැඩි කරනවාට වඩා බදු ගෙවීමට තරම් ආදායම් ඇති එහෙත් බදු නොගෙවා සිටින අය බදු පදනමට විද්‍යානුකූල ලෙස එකතුකර ගැනීමෙන් රටේ බදු ප්‍රතිපත්තිය සාධාරණව, විනිවිදභාවයෙන් යුක්තව සහ වගකීමෙන් යුක්ත බවට පත්කිරීමට නිර්දේශ කරනු ලැබේ.	මෙම නිර්දේශය සමඟ එකඟ වේ. බදු අනුපාත ඉහළ නැංවීම කෙටි කාලීන උපක්‍රමයක් වන අතර බදු පදනම පුළුල් කිරීම සඳහා දැනටමත් දෙපාර්තුමේන්තුව විසින් බදු නොගෙවන පුද්ගලයින් සඳහා ආදායම් ලිපි ගොනු විවෘත කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් සිටියි. ඒ අනුව, 2024.05.31 දින දක්වා බදු ගෙවන්නන් ලියාපදිංචි කිරීමේ ප්‍රගතිය **ඇමුණුම 01** මගින් ඉදිරිපත් කර ඇත. බදු ගෙවන්නන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේදී පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම තුළින් බදු ලිපිගොනු සංඛ්‍යාව ඉහළ නැංවීමට දැනටමත් කටයුතු කර ඇත. I) අවුරුදු 18ට වැඩි සියලුම පුද්ගලයින් දේශීය ආදායම් දෙපාර්තුමේන්තුව තුළ ලියාපදිංචි කිරීමේ කටයුතු දැනටමත් ආරම්භ කර ඇති අතර, මේ තුළින් බදු බැඳියාවක් ඇති පුද්ගලයින් හඳුනාගෙන ආදායම් බදු සඳහා ලියාපදිංචි කිරීමට කටයුතු කරමින් සිටියි. **(ඇමුණුම 02)** II) 2024 අයවැය යෝජනා ප්‍රකාරව හඳුනා ගත් ආයතනවල සේවාවන් ලබා ගැනීමේදී බදු ලිපිගොනු අංකය අනිවාර්ය කර ඇති අතර, ඒ අනුව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තුමේන්තුවේ නව ලියාපදිංචි කිරීම්, පැවරීම් කිරීමේදී හා වාර්ෂික ආදායම් බලපත්‍ර ලබා ගැනීමේදී, ඉඩම් ලියාපදිංචිය පැවරීමේදී, වාණිජ බැංකුවල ජංගම ගිණුම් විවෘත කිරීමේදී අනිවාර්යෙන් TIN අංකයක් ලබා ගත යුතු වේ. ඒ තුළින් බදු බැඳියාවන් සහිත පුද්ගලයින් හඳුනාගෙන ආදායම් බදු සඳහා ලියාපදිංචි කිරීම සිදු කරනු ලැබේ. **(ඇමුණුම 02)** III) තුන් වන පාර්ශවීය ආයතන වෙතින්, එම ආයතනවල කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු ලබාගෙන එකවර ආදායම් බදු සඳහා සෘජුව ලියාපදිංචි කිරීම (Bulk

		Registration) ක්‍රියාත්මක කරගෙන යනු ලැබේ. IV) Interface Agencies හරහා තොරතුරු ලබා ගැනීමේ ක්‍රියාවලිය දැනටමත් ආරම්භ කර ඇත. V) බදු පැහැරහරින්නන් පිළිබඳ මහජනතාවට සෘජුවම තොරතුරු සැපයීම සඳහා IRD web අඩවිය තුළ වෙනම පහසුකම් සපයා ඇති අතර නිවැරදි ලෙස තොරතුරු සපයන්නන් සඳහා (බදු පැහැරහරින්නන් පිළිබඳව) ත්‍යාග ලබාදීමේ ක්‍රමයක්ද හඳුන්වා දී ඇත. 2024.01.01 දින සිට 2024.04.29 දක්වා තොරතුරුකරුවන් 174ක් විසින් තොරතුරු ලබා දී ඇති අතර මෙම තොරතුරු පිළිබඳව විමර්ශනය කිරීම සඳහා විමර්ශන අංශය වෙත යොමු කර ඇත. VI) බදු සඳහා ලියාපදිංචි වී නොමැති පුද්ගලයින්ට තම ස්වකැමැත්ත මත ස්වේච්ඡාවෙන් ලියා පදිංචිය ලබා ගැනීම සඳහා e-service පහසුකම් සපයා ඇත. VII) විශේෂයෙන් පුහුණු කරන ලද දේශීය ආදායම් නිලධාරීන් (Tax Consultation Unit) ආයතන පරිශ්‍රයන් වෙත ගොස් බදු ලියාපදිංචිවීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ගෙන යනු ලැබේ. 2024.01.01 දින සිට 2024.04.29 දක්වා බදු ගෙවන්නන් දැනුවත් කිරීමේ වැඩසටහන් 28ක් නිම කර ඇත. VIII) සියලුම මාධ්‍ය හරහා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. IX) තාවකාලික VAT ලියාපදිංචියට අදාළ ලේඛන පරීක්ෂා කර බලා බදු වර්ග සඳහා ලියාපදිංචි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ගෙන යයි. 2022 හා 2023 තක්සේරු වර්ෂවලට අදාළව තාවකාලික VAT ලියාපදිංචිය යටතේ භාණ්ඩ ආනයනය කළ ආනයනකරුවන් 2520 ක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් පාලනය කරනු ලබන බදු වර්ගයක් සඳහා ස්ථිර ලියාපදිංචිය ලබාදී ඇත. මෙම ක්‍රියාවලිය සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ගය පිළිබඳ දැනටමත් ක්‍රම සහ විධි පිළිබඳ කමිටුව වෙත වාර්තාවක් ඉදිරිපත් කර ඇත. **(ඇමුණුම 03)**

		එමෙන්ම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර චක්‍රලේඛයේ පිටපතක් **ඇමුණුම 04** යටතේ ඉදිරිපත් කර ඇත. බදු පදනම පුළුල් කිරීමේ මූලික අඩිතාලමක් ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඉහත ක්‍රියාමාර්ග ගෙන ඇත. මේ අනුව බදු පදනම පුළුල් කිරීම තුළින් බදු අනුපාත අඩු කිරීමක් ඉදිරියේදී සිදු කල හැකි බව නිරීක්ෂණය වේ.
5.3.2	බදු එකතු කිරීමේ ක්‍රමවේදයේ කාර්යක්ෂමතාවය හා විනිවිදභාවය වැඩි කිරීම සඳහා සියළු ගනුදෙනු ඩිජිටල් වේදිකාවක් මතට ගෙන ඒම සුදුසු යැයි නිර්දේශ කෙරේ. (මෙම වාර්තාවේ අංක 8 ලෙස සඳහන් "ශ්‍රී ලංකා රුපියල ඩිජිටල් මුදල් ඒකකයක් ලෙස භාවිතා කිරීම ක්‍රියාත්මක කිරීම" වෙත යොමු වන්න)	මෙම යෝජනාව සමඟ එකඟ වේ. මෙම යෝජනාව ක්‍රියාවට නැංවීම පිළිබඳව මහ බැංකුව විසින් අධ්‍යයනය කරමින් පවතී. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් 2024.04.04 දිනැතිව නිකුත් කරන ලද අංක 2378/33 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතෙන් පරිපාලනය වන බදු ගෙවීම්, මාර්ගගතව ගෙවීම සඳහා විධිවිධාන පනවා ඇත. **(ඇමුණුම 05)** සැබෑ ගනුදෙනු සඳහා ඩිජිටල් වේදිකාවක් හඳුන්වාදීම තුළින් බදු පරිපාලනය පහසු වන අතර බදු ක්‍රමය තුළ විනිවිදභාවය වැඩි දියුණු කළ හැකිය. මෙම ක්‍රියාවලියෙහි මූලික අඩිතාලමක් ලෙස දෙපාර්තමේන්තුව විසින් රුපියල් ලක්ෂ පහකට වඩා වැඩි සියලුම ගනුදෙනු Electronically සිදුකළ යුතු බවට නීතිමය රෙගුලාසි දැනටමත් පනවා ඇත. බදු පදනම පුළුල් කිරීම සඳහා පුරවැසියන්ගේ තොරතුරු ඉලෙක්ට්‍රොනිකව ලබා ගැනීම සඳහා සියලු ගනුදෙනු Unique Digital ID එකක් හරහා සිදු කිරීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන හා පසුබිම ස්ථාපිත කිරීම සඳහා දෙපාර්තමේන්තුව ද එකඟ වේ.
5.3.3	ස්වයං තක්සේරුව මත පදනම්වූ බදු ක්‍රමයක සඵලතාවය යම් රටක තාක්ෂණික යටිතල පහසුකම් සහ සමස්ථ බදු සංස්කෘතිය වැනි සාධක මත රඳා පවතින බැවින්, පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ. අ) බදු එකතු කිරීමේ හා බදු පරිපාලනයේ තාක්ෂණික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ නවීකරණය කිරීම	මෙම නිර්දේශය සමඟ එකඟ වේ. අ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වන සියලුම ප්‍රධාන බදු වර්ග (ආදායම් බද්ද, එකතු කළ අගය මත බද්ද, රඳවා ගැනීමේ බද්ද, ප්‍රාග්ධන ලාභ මත බද්ද, උපයන විට ගෙවීම්

		බද්ද, සමාජ ආරක්ෂක දායකත්ව බද්ද) පරිපාලනය කිරීම සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීය පද්ධතියක් මගින් සිදුකරනු ලැබේ. ඒ අනුව බදු ගෙවන්නන් ලියාපදිංචි කිරීම, වාර්තා නිකුත් කිරීම හා භාර ගැනීම, බදු ගෙවීම හා එකතු කිරීම RAMIS පද්ධතිය හරහා සිදුකරනු ලැබේ. එහිදී බදු ගෙවන්නන් වෙත online පහසුකම යටතේ බදු ගෙවීමේ අවස්ථාව ලබා දී ඇත. **(ඇමුණුම 06)** තවද RAMIS පද්ධතිය බදු ගෙවන්නන් සහ බදු නියෝජිතයින් වෙත e-සේවාව මගින් පහත සේවාවන් සපයනු ලබයි. * බදු ගෙවන්නන් ලියාපදිංචිය TIN සහ බදු වර්ග සඳහා ලියාපදිංචිය බදු නියෝජිතයන් ලියාපදිංචිය e-සේවාව සඳහා පිවිසීමට PIN අංක ලබා ගැනීම බදු ගෙවන්නා වෙනුවෙන් නියෝජිතයෙකුට, සේවකයෙකුට බලය පැවරීම බදු ගෙවන්නාගේ තොරතුරු යාවත්කාලීන කිරීම ලියාපදිංචි බදු වර්ග සම්බන්ධයෙන් තොරතුරු * බදු වාර්තා ලබා දීම SVAT/CIT/IIT/PIT/PAYE/APIT/VAT/ WHT/AIT/VAT on Financial Services/SD
	ආ) බදු ගෙවන්නන්ට තම තක්සේරු වාර්තා ඉදිරිපත් කිරීම සඳහා මාර්ගගත වේදිකා ක්‍රියාත්මක කිරීම	ආ) සංස්ථාපිත ආදායම් බදු, පුද්ගල ආදායම් බදු, එකතු කළ අගය මත බදු, භවුල් ව්‍යාපාර ආදායම් බදු, එකතු කළ අගය මත බදු මූල්‍ය සේවා, රඳවා ගැනීමේ බදු (AIT and APIT) වාර්තා ඉදිරිපත් කිරීම සඳහා බදු ගෙවන්නන් වෙත මාර්ගගත වේදිකාව (e-filing) පහසුකම් සපයා ඇත. තවද තක්සේරු වර්ෂ 2021/2022 සිට සංස්ථාපිත ආදායම් බදු වාර්තා හා තක්සේරු වර්ෂ 2023/2024 සිට පුද්ගල ආදායම් බදු වාර්තා e-service මගින් ලබාදීම අනිවාර්ය කර ඇත. (Mandatory E-filing) ඒ අනුව, 2023/2024 තක්සේරු වර්ෂයේ සිට මුද්‍රිත බදු වාර්තා භාර නොගනී.
	ඇ) බදු ගෙවන්නන් විසින් වාර්තා කරන ලද දත්ත සත්‍යාපනය කිරීමට උපකාරී වන තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ අනෙකුත් අදාළ ආයතන අතර සහයෝගීතාව වර්ධනය	ඇ) තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා අනෙකුත් ආයතන RAMIS පද්ධතිය හා සම්බන්ධ කිරීමේ ක්‍රියාවලිය (Interface Agencies) දැනටමත් ආරම්භ කර ඇත. ඒ පිළිබඳ සාරාංශය **ඇමුණුම 07** මගින් දක්වා ඇත.

	කිරීම (මෙහිදී මුදල් ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය අමාත්‍යාංශය, ආහාර පාලන පරිපාලන ඒකකය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, කොළඹ මහනගර සභාව සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ඒකාබද්ධ කිරීම යෝජනා කර ඇත.)	
5.3.4	රඳවාගත් බදු පියවීම සඳහා වසර තුනක කාල රාමුවක් සැකසීම නිර්දේශ කරනු ලැබේ. නියමිත කාලසීමාව තුළ බදු ගෙවා නොමැති නම්, ගිණුම් අත්හිටුවීම හෝ දේපළ (වත්කම්) අත්පත් කරගැනීම වැනි සුදුසු පිළියමක් මගින් නියමිත මුදල අයකර ගැනීම නිර්දේශ කරනු ලැබේ.	**5.3.4** නිර්දේශය හා එකඟ වේ. 2023/12/31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ පවතින මුළු හිඟ බදු රුපියල් බිලියන 1066 තුළ තාවකාලිකව අත්හිටවූ හිඟ බදු ශේෂය (Held over) රුපියල් බිලියන 878 කි. අයකර ගත හැකි හිඟ බදු ශේෂය රුපියල් බිලියන 188කි. පහත දක්වා ඇති හේතූන් නිසා හිඟ බදු අය කිරීම, තාවකාලිකව අත්හිටුවීමට සිදුවේ. • අභියාචනා ක්‍රියාවලියේ පැවතීම • විරෝධතා ලබා දීම • හිඟ බදු අය කර ගැනීම සඳහා පවරන ලද නඩු • වෙනත් (ආපසු ගෙවීම් හා වැඩිපුර ගෙවීම් මගින් හිඟ බදු නිරවුල් කිරීමට ඉල්ලා සිටීම) හිඟ බදු අයකිරීම් අත්හිටුවීමට ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත්තේ අදාළ තක්සේරුව අභියාචනා ක්‍රියාවලිය තුළ පැවතීමයි. එම අභියාචනා අතරින් බොහොමයක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මට්ටමින් ආරම්භ වී බදු අභියාචනා කොමිෂන් සභාව, අභියාචනාධිකරණය, ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා පවත්වාගෙන යනු ඇත. දෙපාර්තමේන්තු මට්ටමේ පවතින අභියාචනා නිශ්චිත කාල සීමාවක් තුළ විසඳා අවසන් කරනු ලැබේ. නමුත් බදු අභියාචනා කොමිෂන් සභාවේ සිට ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා සිදු වන අභියාචනා විසඳීම

		සඳහා නිශ්චිත කාල රාමුවක් සකස් කිරීම ප්‍රායෝගික නොවේ. 2024.01.01 දින සිට 2024.04.30 දක්වා හිඟ බදු නිරාකරණය කිරීම මගින් රු. 25,700,020,131.93ක් හිඟ බදු ශේෂයෙන් අඩු කර ඇත. ඊට අමතරව, හිඟ බදු නිරාකරණය කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග ගෙන ඇත. බැංකු තහනම් නියෝග නිකුත් කිරීම - රු. 11,170,843,820.54 නීති කෘත්‍ය ආරම්භ කිරීම - රු. 5,037,183,608.69 ගෙවීම් සැලසුම් ලබා දීම - රු. 6,669,671,165.31
5.3.5	ස්වයං - තක්සේරුකරණයේදී එම තක්සේරු වාර්තා, තක්සේරු කිරීමේදී සහ විගණන ක්‍රියාවලියේදී, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් විසින් කරනු ලබන මානව මැදිහත්වීම අවම කළ යුතු බව ද නිර්දේශ කරනු ලැබේ.	**5.3.5** ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) නිර්දේශ අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ අවදානම් කළමනාකරණ අංශයක් (Risk management unit) ස්ථාපිත කර ඇත. මෙම අංශය මගින් විවිධ නිර්නායක යටතේ විගණනය කළ යුතු බදු ගෙවන්නන් පිළිබඳව අවදානම් වර්ගීකරණයක් සිදු කර (Risk Rating) අදාළ අංශ වෙත විගණනය සඳහා යොමු කරනු ලැබේ. මේ යටතේ දැනටමත් විගණනය සඳහා වන බදු ගෙවන්නන්ගේ තොරතුරු විශාල බදු ගෙවන්නන්ගේ අංශය වෙත පද්ධතිය මඟින් යොමු කරනු ලබයි. RAMIS පද්ධතිය මගින්ද Risk Criteria පදනම් කර ගෙන ලිපි ගොනු විගණනය සඳහා අදාළ නිලධාරීන් වෙත ස්වයංක්‍රීයව පැවරීමේ හැකියාව ඇත. මෙම ක්‍රියාවලිය දැනටමත් මූලික අදියරෙහි පවතින අතර, තුන්වන පාර්ශවයන් මගින දත්ත හුවමාරු කරගැනීමේ (Third Party Data Sharing) ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමෙන් පසු මෙම ක්‍රියාවලිය මානව මැදිහත් වීම අවම කරමින් තවදුරටත් ශක්තිමත් වනු ඇත.
5.3.6	වසර 2ක කාලයක් තුළ දෙපාර්තමේන්තුවේ ස්වයං තක්සේරුව සහ පරිපාලන සමාලෝචනය සිදු කර නිම කිරීම සඳහා 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට නීතිමය සංශෝධන හඳුන්වාදීමට නිර්දේශ කරනු ලැබේ.	**5.3.6** මෙම නිර්දේශය හා එකඟ වේ. මෙම නිර්දේශය සාක්ෂාත් කර ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය මඟින් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයෙකුගේ ප්‍රධානත්වයෙන් දැනටමත් කමිටුවක් පත් කර ඇත. එම කමිටුව මඟින් ආංශික කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන් යටතේ වන 4 (හතර) වන නිර්දේශය අනුව බදු අභියාචනා කොමිෂන් සභාවේ හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් වෙනමම පත්කිරීමට කටයුතු කර ඇත. එකී

		කමිටුව මේ වන විට කිහිපවරක් රැස් වී දේශීය ආදායම් පනතට සිදු කල යුතු සංශෝධන හඳුනාගෙන ඇත. එසේම පාර්ලිමේන්තුවේ වෙනත් ආංශික කාරක සභාවක් මඟින් සාකච්ඡා වූ කරුණු ඇසුරින් ඉදිරිපත් කරන ලද සංශෝධනයන් ද එකී කමිටුව මඟින් සමාලෝචනයට ලක් කර ඇත. ඒ අනුව බදු අභියාචනා ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා ගතවන කාලය අඩු කිරීම සඳහා දේශීය ආදායම් පනත සඳහා සිදු කළ යුතු සංශෝධන හඳුනාගෙන ඒ සඳහා භාණ්ඩාගාර ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගෙන එකී පනත් සංශෝධනයන් සිදු කිරීමට කටයුතු කරන ලෙස රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇත.
5.3.7	බදු අභියාචනා කොමිෂන් සභාව තුළ අභියාචනා විභාග කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට නිර්දේශ කරන අතර අවශ්‍ය නම් 2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභා පනතට නීති සංශෝධන හඳුන්වා දීමට යෝජනා කෙරේ.	**5.3.7** මෙම නිර්දේශය සාක්ෂාත් කර ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය මඟින් නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරයෙකුගේ ප්‍රධානත්වයෙන් දැනටමත් කමිටුවක් පත් කර ඇත. එම කමිටුව මඟින් ආංශික කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන් යටතේ වන 4 (හතර) වන නිර්දේශය අනුව බදු අභියාචනා කොමිෂන් සභාවේ හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් වෙනමම පත්කිරීමට කටයුතු කර ඇත. එකී කමිටුව මේ වන විට කිහිප විටක් රැස්වී බදු අභියාචනා ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා බදු අභියාචනා කොමිසමේ කාර්යක්ෂමතාවය වැඩි කිරීමට ඔවුන් විසින් ඉල්ලා ඇති කාර්ය මණ්ඩල අවශ්‍යතා, පරිගනක හා වෙනත් උපකරණ අවශ්‍යතා, දත්ත පද්ධතියක් සැකසීමේ, පවත්වාගෙන යාමේ අවශ්‍යතා හා ප්‍රගතිය භාණ්ඩාගාර ලේකම් වෙත මාසිකව වාර්තා කිරීමේ ක්‍රමවේදයක් සැකසීමේ අවශ්‍යතා හඳුනාගෙන ඇත. ඒ සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය මේ වන විට ලබා ගෙන ඇති අතර, ඒ අනුව ඉදිරි කටයුතු කරන ලෙස දන්වා බදු අභියාචනා කොමිසමට හා අදාළ දෙපාර්තමේන්තු වෙත ලිඛිතව දැනුම් දී ඇත. එයට ද අතිරේකව බදු අභියාචනා කොමිසම තුළ අභියාචනා සඳහා ගතවන කාලයද අවම කිරීම සඳහා බදු අභියාචනා කොමිෂන් සභා පනත වෙත සිදු කල යුතුව ඇති සංශෝධන ද හඳුනාගැනීමේ කටයුතු සිදු කරමින් පවතින අතර ඒ අනුව, එසේ හඳුනා ගනු ලබන නීතිමය ප්‍රතිපාදන සංශෝධනයන්ද ක්‍රියාවට නැංවීමට හා එමඟින් අභියාචනා විසඳීමේ ක්‍රියාවලිය

		තවදුරටත් කාර්යක්ෂම කිරීමට කටයුතු කෙරෙනු ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමස්ථ බදු අභියාචනා ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා ඉහත කමිටුව වෙත ලබා දෙන ලද යෝජනා **ඇමුණුම 08** මගින් දක්වා ඇත.
5.3.8	බදු ගෙවන්නෙකුගේ සාමාන්‍ය ලියාපදිංචියේදී සහ බදු ගෙවන්නන් සමූහ වශයෙන් ලියාපදිංචි කිරීමේදී බදු ගොනුවක් විවෘත කිරීමට භාවිතා කරන පරාමිතීන් සංඛ්‍යාව 5 දක්වා අඩු කිරීමට නිර්දේශ කරනු ලැබේ.	**5.3.8** දැනටමත් සමූහ ලියාපදිංචි කිරීමේ දී (Bulk Registration) භාවිතා කරනු ලබන්නේ පරාමිතීන් 5ක් පමණි. කෙසේ වෙතත් බදු ගෙවන්නෙකුගේ සාමාන්‍ය ලියාපදිංචි කිරීමේ දී අනිවාර්ය පරාමිතීන් 15ක් පමණ ඇති අතර, එම පරාමිතීන් බදු පරිපාලනයේ දී අත්‍යාවශය පරාමිතීන් වේ. එක් එක් පරාමිතීන් වල ඇති අවශ්‍යතාවය **ඇමුණුම 09** මඟින් දක්වා ඇත. තව ද සමූහ ලියාපදිංචිවීමේ දී පරාමිතීන් 5ක් යොදා ගනු ලැබුවද නිලධාරීන් විසින් පසුව (Profile Update) මඟින් අනෙකුත් අත්‍යවශ්‍ය පරාමිතීන් ද සම්පූර්ණ කර ගත යුතු වේ. එසේ කිරීමෙන් බදු ගෙවන්නා පිළිබඳව නිවැරදි තොරතුරු පද්ධතියේ ඇතුළත්ව තිබීම හේතුවෙන් අපේක්ෂිත කාර්යක්ෂම බදු පරිපාලනය පහසු වෙයි. ඒ අනුව, සමූහ ලියාපදිංචිය මගින් 2024.05.31 දින වන විට බදු ගෙවන්නන් 413,343ක් ලියාපදිංචි කර ඇත.
5.3.9	ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) 2.0 ක්‍රමයේ දැනට කරගෙන යනු ලබන නඩත්තු කටයුතු පවත්වාගෙන යාමට සහ බදු ප්‍රතිපත්ති වෙනස්වීම් නිසා ඇතිවන නව තත්ත්වයන් ක්‍රියාවේ යෙදවීම සඳහා විවෘත ටෙන්ඩර් කැඳවීමක් මගින් රාජ්‍ය - පුද්ගලික හවුල්කාරිත්ව (PPP) රාමුවක් ස්ථාපිත කිරීමට නිර්දේශ කෙරේ.	**5.3.9** RAMIS 2.0 පද්ධතිය තුළ Modular 26ක් පවතින අතර එම Modular සියල්ල පද්ධති ගත කර ඇත. පද්ධතිය නඩත්තු කිරීමේ කොන්ත්‍රාත්තුව SCE ආයතනය වෙත පවරා තිබූ ගිවිසුම 2024.01.31 දිනට අවසන් වී ඇති අතර, එම කොන්ත්‍රාත්කරු වෙතම ඉදිරි වසර 3කට අදාළව RAMIS පද්ධතිය නඩත්තු කිරීමේ කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රදානය කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇත. එම ගිවිසුම තුළ පද්ධතිය IRD වෙතට පවරා දීමේ සැලැස්මද ඇතුළත්ව ඇත. මෙම පද්ධතිය පවරා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2024/04/10 දින පැවති සමාලෝචන රැස්වීමේදී රාජ්‍ය - පුද්ගලික හවුල්කාරිත්ව (PPP) රාමුවක් ස්ථාපිත කිරීමට අදාළ ක්‍රමවේදය සලකා බැලීම සඳහා මුදල් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර නිර්දේශ ලබා ගැනීමට තීරණය කර ඇත.

5.3.10	දැනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන තොරතුරු තාක්ෂණ නිලධාරීන් විධිමත් පුහුණුවකට ලක් කිරීම හා අදාළ තත්ත්වයන්ට ඔරොත්තු දෙන ආකාරයට වැඩි දියුණු කිරීමට නිර්දේශ කෙරේ.	**5.3.10** දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ සේවය කරනු ලබන තොරතුරු තාක්ෂණික නිලධාරීන්, තොරතුරු තාක්ෂණ සේවය හරහා වසර 5ක කාලසීමාවක් සඳහා දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරනු ලබන අතර ස්ථීර තොරතුරු තාක්ෂණ නිලධාරීන් කණ්ඩායමක් දෙපාර්තමේන්තුව තුළ සේවයේ නොයෙදෙයි. 5.3.9 යටතේ ලැබෙන නිර්දේශ පදනම් කරගෙන මෙම නිර්දේශය ක්‍රියාවට නැංවිය හැක. දැනට දේශීය ආදායම් සේවයේ යෙදී සිටින, තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම ඇති නිලධාරීන් මේ සඳහා අනුයුක්ත කර ඔවුන් වෙත අවශ්‍ය පුහුණුව ලබා දෙන ලෙසත්, ඉදිරි බඳවා ගැනීම්වලදී තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම ඇති නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කරන ලෙසත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත.
5.3.11	නියාමනය නොකළ මූල්‍ය වෙළඳපොළ ග්‍රහණය කිරීමේ සහ නියාමනය කිරීමේ අරමුණින්, පුද්ගලික පාසැල් සිසුන් 100 කට වැඩි විශාල පරිමාණ පුද්ගලික උපකාරක පංති, සෞඛ්‍ය සේවා සපයන මධ්‍යස්ථාන, පෞද්ගලික රෝහල්, මිනින්දෝරුවරුන්, ඉංජිනේරුවන්, නීති ආයතන සහ රූපවාහිනී සහ ගුවන්විදුලි දැන්වීම් මගින් උපයන සැබෑ ආදායම සොයා ගැනීමට ග්‍රාම නිලධාරීන්ගේ සහාය ඇතිව ජංගම යෙදුමක් භාවිතයෙන් යාන්ත්‍රණයක් සැකසීම නිර්දේශ කෙරේ.	5.3.11 මෙම නිර්දේශය සමඟ එකඟ වේ. මේ වනවිටත් නිර්දේශිත වෘත්තිකයන් විශාල ප්‍රමාණයක් ආවරණය වන පරිදි අංක 2334/21 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය නිකුත් කර ඇත.**(ඇමුණුම 10)** මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2024/04/10 දින පැවති සමාලෝචන රැස්වීමේදී මේ පිළිබඳව සාකච්ඡා කළ අතර, ඒ සඳහා අදාළ වන Mobile APP එකක් සකස් කිරීම සඳහා අවශ්‍ය වන මූලික පියවරයන් ලෙස අවශ්‍යතා අධ්‍යයනය කරමින් පවතී.
5.3.12	පවතින බදු කිසිවක් ඉහළ නැංවීමේ අවශ්‍යතාවයකින් තොරව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු ආදායම 50% කින් ඉහළ නැංවිය හැකි ඒකාබද්ධ ආදායම් කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස නිර්දේශ කෙරේ.	**5.3.12** බදු ආදායම ඉහළ නැංවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

5.3.13	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ දක්වා ඇති නීතිමය ප්‍රතිපාදන ප්‍රකාරව, පහත සඳහන් අවස්ථා තුනේදී පුද්ගලික සමාගම් විසින් උපයාගත් අනිසි ලාභයට අදාළ නියමිත බදු අයකර ගැනීම නිර්දේශ කෙරේ. • 2020 ඔක්තෝබර් සිට 2021 පෙබරවාරි දක්වා කාලය තුළ සීනි ආනයනය සඳහා වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයකට රු. 50 සිට ශත 25 දක්වා අඩු කිරීම හේතුවෙන් රජයට රුපියල් බිලියන 16 ක බදු ආදායමක් අහිමිවූ බවත් මහා පරිමාණ සීනි ආනයනකරුවන් විශාල බදු ප්‍රතිලාභයක් හා සැලකිය යුතු ලාභයක් ද උපයාගෙන ඇති බවත් විගණකාධිපතිවරයා හෙළිකර තිබුණි.	**5.3.13** සීනි ආනයනකරුවන් විසින් වැඩි ලාභ ලබාගෙන නිවැරදි බදු ගෙවීම් සිදු නොකර, බදු ගෙවීම් පැහැර හැර තිබේද යන්න පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ වෙනම කමිටුවක් පත්කර ඇති අතර අදාළ විගණන කටයුතු විමර්ශණ අංශය තුළ සිදු කරගෙන යනු ලැබේ. 2020 ඔක්තෝබර් මස 14 දින සිට, එවකට පැවති කොරෝනා වසංගත තත්ත්වය සැලකිල්ලට ගෙන පාරිභෝගික ජනතාවට සහනයක් ලෙස සීනි, පරිප්පු, බොම්බයි ළූනු ඇතුළු භාණ්ඩ 04ක් සඳහා පැවති බදු ශත 25 දක්වා අඩු කිරීමට එවක ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි කටයුතු කර ඇත. විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සඳහන් වන්නේ 2020 ඔක්තෝබර් සිට 2021 පෙබරවාරි දක්වා කාලය තුළ සීනි ආනයනය කරන ලද ප්‍රමාණය මත පදනම්ව රු. 50/- බද්ද වෙනුවට ශත 25ක බද්ද ක්‍රියාත්මක කිරීම හේතුවෙන් කිලෝග්‍රෑමයට රු. 49.75 ක් වශයෙන් කැප කළ බදු ආදායමේ වටිනාකමයි. මෙලෙස රජය කැපකළ බදු ආදායම මුදල් අමාත්‍යාංශය විසින් රාජ්‍ය මුදල් කමිටුව වෙත 2021.03.05 දින යොමුකර ඇති වාර්තාවේද සඳහන් කර ඇත. ඒ අනුව, රජය කැපකළ බදු ආදායම රුපියල් බිලියන 16ක අගයක් ලෙස ගණනය කර ඇතත්, මෙම ගණනය කිරීම මත පදනම්ව නොව, සීනි සඳහා වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රු 50/- සිට ශත 25 දක්වා අඩු කිරීම හේතුවෙන් මහා පරිමාණ සීනි ආනයනකරුවන් සත්‍ය වශයෙන් ලැබූ බදු ප්‍රතිලාභය හා ඒ මත උපයාගෙන ඇති අමතර ලාභයක් වෙතොත් ඒ මත දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් බදු අයකළ යුතු වේ.
	• 2023 අගෝස්තු මාසයේදී තිරිඟු ආනයනය කරන සමාගම් දෙකක් සඳහා (ප්‍රීමා සහ සෙරන්ඩිබ්) හැර අනෙකුත් තිරිඟු පිටි ආනයන සමාගම් වලට තිරිඟු පිටි ආනයනය කිරීම රජය විසින් තහනම්කර තිබූ අතර එම තහනම් කාලය තුළ මෙම සමාගම් දෙක විශාල වශයෙන් පිටි තොග රැස් කරගෙන තිබුණි. තිරිඟු පිටි	තිරිඟු පිටි වශයෙන් සෘජුව ආනයනය කිරීම ඉතා අඩු මිලකට සිදු කර, දේශීය වෙළඳපලේ ඉතා ඉහළ මිලකට අලෙවි කරමින් තිරිඟු පිටි ආනයනකරුවන් ලැබූ අමතර වාසිය රජයට අයකර ගැනීම සඳහා තිරිඟු පිටි මත බද්ද වැඩි කරන තෙක් තාවකාලික පියවරක් වශයෙන් සෘජුව තිරිඟු පිටි ආනයනය 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනත යටතේ ආනයන බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාවයට යටත් කරන ලදී. (වෙළඳපලේ අඩුමිලට ආනයනය කළ පිටි තොග සඳහා බදු වැඩි කළ විට බලපෑමක් ඇති නොවන පරිදි)

	කිලෝග්‍රෑමයකට රු. 16.00 ක බද්දක් පැනවීමෙන් පසුව ඔවුන් විසින් සැලකිය යුතු ලාභයක් උපයාගෙන තිබුණි.	ඒ අනුව, නැවත ආනයන පාලන රෙගුලාසි ඉවත් කර, 2023.08.30 දින සිට තිරිඟු පිටි වශයෙන් සිදු කරන ආනයන සඳහා පැවති බද්ද කිලෝග්‍රෑමයකට 15% හෝ කිලෝග්‍රෑමයට රු.16/- සිට 20% හෝ කිලෝග්‍රෑමයට රු. 27/- දක්වා සංශෝධනය කිරීමටත්, තිරිඟු ඇට ආනයනය කර පිටි නිෂ්පාදනය කරන සමාගම් දෙකක් සඳහා (ප්‍රීමා සහ සෙරන්ඩිබ්) ලබා දී තිබූ සම්පූර්ණ තීරුබදු සහනය, එනම් 15% හෝ කිලෝග්‍රෑමයකට රු. 12/- ක් වූ බදු සහනය ඉවත් කර ඒ වෙනුවට 5% හෝ කිලෝග්‍රෑමයකට රු. 6/- ක තීරු බද්දක් 2023.08.30 දින සිට අය කිරීමටත් කටයුතු කර ඇත.
	• 2023.11.01 දින සීනි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ශත 25 සිට රුපියල් 50.00 දක්වා වැඩිකරන ලද අතර, බද්ද වැඩි කිරීමට පෙර සීනි ආනයනකරුවන් විසින් ආනයනය කර ගබඩාවල රැස්කර තිබූ සීනි ටොන් 8500කට ආසන්න ප්‍රමාණයක් වෙළඳපොළට නිකුත් කිරීමෙන් සැලකිය යුතු අනිසි ලාභයක් ලබා ඇත.	ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ එකඟතාවයන්ට යටත්ව සීනි බද්ද 2023.11.01 දින සිට නැවත රු. 50/- දක්වා වැඩි කිරීම සිදු කරන ලදී. එහෙත් ඊට සමානුපාතිකව වෙළඳපලේ සීනි මිල රු. 50/- කින් පමණ වැඩි වීමක් සිදු නොවූ බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු දත්ත මගින් සනාථ වේ. (උදා:- 2023 ඔක්තෝබර් මස සාමාන්‍ය කිලෝග්‍රෑමය රු. 272/- 2023 නොවැම්බර් මස පළමු සතිය කිලෝග්‍රෑමය රු. 290/-)
5.3.14	මුදල් අමාත්‍යාංශය මගින් බදු පරිපාලනය සහ බදු එකතු කිරීම, කාර්යක්ෂමතාව, සාධාරණත්වය සහ ස්ථාවරත්වය ප්‍රවර්ධනය කරන අයුරින් රටේ බදු ප්‍රතිපත්තියේ පවතින නොගැළපීම් ඉවත්කිරීමට නිර්දේශ කෙරේ.	**5.3.14** බදු ප්‍රතිපත්ති සකස් කිරීමේ ක්‍රියාවලිය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන අතර බදු ප්‍රතිපත්තීන්වල ස්ථාවරත්වය රඳවා ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු ප්‍රතිපත්ති අංශය මගින් අවශ්‍ය නිර්දේශ ලබා දෙනු ලැබේ.
5.3.15	වාහන ලියාපදිංචිය, ඉඩම් සහ නිශ්චල දේපළ ඇතුළු දේපළ අත්පත්කර ගැනීම සහ විදුලිය සඳහා බාධාවකින් තොරව ප්‍රවේශය සහතික කිරීම සඳහා බදු ගොනුවක් විවෘත කිරීම සහ බදු ගෙවීමේ වගකීම් ඉටුකිරීම අනිවාර්ය අවශ්‍යතා බවට පත්කිරීමට නිර්දේශ කෙරේ.	**5.3.15** වාහන ලියාපදිංචිය, ආදායම් බලපත්‍ර ලබා ගැනීම, ජංගම ගිණුම් විවෘත කිරීම, ඉඩම් හා නිශ්චල දේපළ අත්පත් කර ගැනීම සිදු කරන අවස්ථාවලදී බදු ලිපිගොනු අංකයක් ලබා ගැනීම දැනටමත් අනිවාර්ය කර ඇත. විදුලිය සඳහා බාධාවකින් තොරව ප්‍රවේශය සහතික කරන අවස්ථාවලදී බදු ලිපි ගොනු අංකය අනිවාර්ය කිරීම සඳහා අදාළ නිර්දේශ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත මෙවර අයවැය යෝජනාවක් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

5.3.16	සමස්ථ ලංකා 15 වන ජන හා නිවාස සංගණනයට සමගාමීව වයස අවුරුදු 18 හෝ ඊට වැඩි සියළුම ශ්‍රී ලංකා පුරවැසියන් සඳහා බදු හඳුනාගැනීමේ අංකය (TIN) වෙනුවට ජාතික හැඳුනුම්පත් අංකය (NIC NUMBER) පදනම් කරගත් ලිපි ගොනුවක් විවෘත කිරීම සඳහා දත්ත බැංකුවක් නිර්මාණය කිරීමට නිර්දේශ කෙරේ.	**5.3.16** දැනට, RAMIS පද්ධතිය විසින් එක් එක් පුද්ගලයා සඳහා අනන්‍ය TIN අංකයක් ජනනය කරන අතර, ලියාපදිංචි නොවන පුද්ගල තොරතුරු ජාතික හැඳුනුම්පත යටතේ පවත්වාගෙන යනු ලැබේ. RAMIS පද්ධතිය තුළ ජාතික හැඳුනුම්පත භාවිතයෙන් වෙනත් ආයතන සමඟ තොරතුරු හුවමාරු කර ගැනීමේ පහසුකම ස්ථාපිත කර ඇත. <u>NIC TIN එකක් ලෙස භාවිතා කළ නොහැකි වීමට හේතු :</u> දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) ශ්‍රී ලාංකික පුරවැසියන් මෙන්ම විදේශිකයන්, සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආයතනද ලියාපදිංචි කර ඔවුන්ට TIN අංක නිකුත් කර ඇත. IRD හි ලියාපදිංචි සියලුම පුරවැසි තොරතුරු TIN අංකය යටතේ පවත්වාගෙන යනු ලබන අතර අනෙකුත් සියලුම පුරවැසි තොරතුරු සබඳතා ජාතික හැඳුනුම්පත (පවුල, සමාගම් අධ්‍යක්ෂවරුන්, ආදිය) යටතේ පවත්වාගෙන යනු ලබයි. TIN අංකය යනු බදු ගෙවන්නන්ගේ ගිණුම් අංකය වන අතර, එය එක් එක් පුද්ගලයාට සහ පුද්ගල නොවන අයට අනන්‍ය වේ. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව දැනට අංක 9 කින් යුත් ජාතික හැඳුනුම්පතක් සහ අංක 12 කින් යුත් ජාතික හැඳුනුම්පතක් නිකුත් කරයි. අනෙක් අතට, කාලයෙන් කාලයට එය වෙනස් විය හැකිය. නමුත් බදු ගෙවන්නන්ගේ ලියාපදිංචි අංකය (TIN) වරින් වර වෙනස් කළ නොහැකි අතර, වැරදි අංකය භාවිතා කිරීමට පද්ධතියට ඉඩ දිය නොහැක. **පැහැදිලිකිරීම:** 1. අනුපිටපත් (Duplicate) සහ වැරදි ලෙස නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත් අංක: පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් අනුපිටපත් කර වැරදි ලෙස ජාතික හැඳුනුම්පත් අංක නිකුත් කරන ලද අවස්ථා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණය කර ඇත. එවැනි ජාතික හැඳුනුම්පත් අංක TIN ලබාගැනීමට ඉදිරිපත් කළ විට RAMIS පද්ධතිය විසින් හඳුනාගනු ලබයි. 2. ආරක්ෂිතභාවය සහ රහස්‍යභාවය: TIN යනු තනි පුද්ගල සහ රහසිගත බදු ලියාපදිංචි අංකයක් වන අතර ජාතික හැඳුනුම්පත ප්‍රසිද්ධියේ ලබාගත හැකි හඳුනාගැනීමේ අංකයකි. ජාතික හැඳුනුම්පත සෘජුවම බදු වාර්තාවලට සම්බන්ධ කිරීම

		බදු ගෙවන්නන්ගේ තොරතුරුවල රහස්‍යභාවයට බාධාවක් විය හැකිය. මේ නිසා, පුද්ගලිකත්වය, දත්ත නිරවද්‍යතාවය සහ බදු ගෙවන්නන්ගේ තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය හේතුවෙන් RAMIS හි TIN ප්‍රාථමික හඳුනාගැනීමේ අංකය ලෙස රඳවා ගැනීමේ වැදගත්කම ඉස්මතු කරයි.
5.3.17	පවතින ආර්ථික අර්බුදයට ප්‍රතිචාර වශයෙන්, සියළුම හිඟ බදු එකතු කිරීම සඳහා දැඩි ප්‍රතිසාධන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කෙරේ. අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) පැනවීම හේතුවෙන් පුහුණු ශ්‍රමිකයන් රට හැරයාමේ තත්ත්වයක් තුළ රට සමාජ ප්‍රාග්ධනය ක්ෂයවීමක් අත්විඳිමින් සිටින අතර ආදායම් ඉහළ නැංවීම සඳහා ඉහළ ලාභ ලබන ආයතනවලින් බදු එකතු කිරීම කෙරෙහි අවධානය යොමුකළ යුතුය.	**5.3.17** මෙම නිර්දේශය සමඟ එකඟ වන අතර දැනටමත් ඉහළ ආදායම් ලබන ආයතනවලින් බදු එකතු කිරීමේ ක්‍රමවේදය කාර්යක්ෂම කිරීමට අදළ ක්‍රියාමාර්ග ගෙන ඇත. මේ අනුව ඉහළ ආදායම් ලබන පුද්ගල (High Wealth Individuals) හා සමාගම් හඳුනාගෙන වෙනම අංශ 06ක් තුළ (Large Tax payer's Office) ස්ථාපිත කර බදු පරිපාලන කටයුතු සිදු කරන අතර එම ලිපිගොනු නිරන්තරයෙන් අධීක්ෂණය කිරීමක් සිදු කරයි. තවද, අවදානම් කළමනාකරණ අංශය මගින් විවිධ නිර්නායක යටතේ විගණනය කළ යුතු බදු ගෙවන්නන් පිළිබඳ අවදානම් වර්ගීකරණයක් සිදු කර (Risk Rating) අදාළ අංශ වෙත යොමු කරනු ලැබේ.

5.3.1 සඳහා පැහැදිලි

ඇමුණුම 1

No of Tax Payers

Taxpayer Category	No of Files As at 31.12.2019	No of Files As at 31.12.2020	No of Files As at 31.12.2021	No of Files As at 31.12.202	No of Files As at 31.12.2023	No of Files As at 31.05.2024
Income Tax						
Corporate						
Resident Companies/Non - Resident Companies	56,460	60,721	68,009	73,444	82,437	88,743
Non - Corporate						
Individuals	281,105	292,712	292,305	204,467	539,862	660,706
Partnerships	17,300	16,949	16,798	13,766	14,800	15,310
Employees paying Income Tax under Pay-As-You-Earn (PAYE)/Advanced Personal Income Tax (APIT) Scheme	1,149,883	209,800	32,702	41,636	242,679	242,679*
Persons registerd for Value Added Tax (VAT)	28,914	8,152	9,070	10,604	13,851	18,372
Persons registerd for Value Added Tax on Financial Services	237	239	246	258	277	284
Persons registerd for Betting & Gamming Levy Taxpayers	635	637	660	624	624	1,248
Persons registerd forSocial Security Contribution Levy Taxpayers				5,422	8,107	8,496
Employers Registerd under PAYE/APIT Scheme	35,448	34,991	34,985	34,596	39,617	40,490
Withholding/Advaned Income Tax (AIT) agent registered for withholding Tax/ AIT on interest	1,627	615	604	612	771	852
Withholding Tax /AIT on Specified Fees (Regular Monthly Schedule Senders)	13,764	43,188	41,862	41,897	44,240	44,746
Stamp Duty (Regular Monthly Schedule Senders)	9,432	9,609	9,854	10,221	10,593	10,672
Total	1,594,805	677,613	507,095	437,547	997,858	1,132,598

*Employees paying Income Tax under Pay-As-You-Earn (PAYE)/Advanced Personal Income Tax (APIT) Scheme taken from the schedule data in each year of Assessment. Therefore this amount would be updated once the PAYE/APIT returns for year of assessment 2023/24 is captured and process in the system.

5.3.1 I සහ II කලාප, යුවතිය

ඇමුණුම 02

Net 18+ registration

Month	Number of TIN
January	50,488
February	51,637
March	22,712
April	27,481
May	261,025
Total	413,343

IIT registration according to the Gazette notification no 2334/21 (No of Professionals registered)	
Month	**Number of Taxpayers**
Jul-23	1,465
Aug-23	2,798
Sep-23	28,367
Oct-23	141,214
Nov-23	117,112
Dec-23	41,956
Jan-24	6,658
Feb-24	5,216
Mar-24	23,118
Apr-24	31,771
May-24	54,256
Total	**453,931**

5.3.1 IX කළු යාපනය

ඇමුණුම 03

Directives given at the meeting of the Committee on Ways and Means held on 02.04.2024

This refers to Committee on Ways & Means letter No: NC/WM/2024/04/02 and dated on 04th April.2024 on about subject.

I am answering the Questions No 7 as follows.

Question 7.

To temporarily suspend the registration of Temporary Value Added Tax (VAT) payers for a duration of two weeks, for the purpose of deterring the registration of Temporary VAT payers and to streamline the process

Answer

Suspension of registration of Temporary Value Added Tax (VAT) is contradictory with the Section 11 of the Value Added Tax Act, No. 14 of 2002, as every person who is willing to import goods into Sri Lanka, shall inform and obtain an identification number from CGIR not later than fourteen days prior to the clearing of such goods.

To streamline the process of registration of Temporary Value Added Tax (VAT), following action has been taken by the IRD.

1. Issue a new circular (CGIR/2024/3-1 (Ins. & Cir.) 09 on April 18, 2024. Circular address some issues highlighted on the report issued by the Joint Committee appointed to study the loss of huge tax revenue to the Government by granting provisional registration for Value Added Tax (VAT) and to recommend appropriate measures.

2. CGIR appoint a new committee to coordinate with Sri Lanka Custom including the responsibility of addressing the issues related to registration of temporary VAT.

3. Required legislation changes in VAT Act. that required to streamline the process have been communicated to Department of Fiscal Policy, Ministry of Finance

5.3.1 IX කදහා ඇමුණුම

ඇමුණුම 04

CGIR/2024/3-1 (Ins. & Cir.) 09 2024.04.18

සියළුම නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරුන්/
ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරුන්/කොමසාරිස්වරුන්/
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරුන්/
නියෝජ්‍ය කොමසාරිස්වරුන්/
සහකාර කොමසාරිස්වරුන්

එකතු කළ අගය මත බදු (වැට් බදු) සඳහා තාවකාලික ලියාපදිංචිය ලබාදීම

එකතු කළ අගය මත බදු (වැට් බදු) සඳහා තාවකාලික ලියාපදිංචියක් ලබාදීමේදී පහත සඳහන් විධිවිධාන වලටද යටත්ව 2024.04.19 දින සිට තාවකාලික ලියාපදිංචිය ලබාදීම සිදුකළ යුතුය.

අ. අපනයන සඳහා පමණක් වන තාවකාලික ලියාපදිංචිය ලබා දීම

දැනට පවතින ක්‍රමවේදයට අනුව ඉදිරි කාලසීමාවන් සඳහා සුදුසු ලෙස තාවකාලික වැට් බදු ලියාපදිංචිය ලබාදිය හැක.

කිසියම් බදු ගෙවන්නකු වැට් බදු සඳහා ස්ථිර ලියාපදිංචිය සඳහා වන සැපයුම් සීමාවේ නොසිටියද, ස්ථ කැමැත්තෙන් ස්ථිර ලියාපදිංචිය ඉල්ලුම් කරන්නේ නම් භාණ්ඩ සැපයුම් බදු නිදහස් අයිතිකරුවන් වුවද ස්ථිර ලියාපදිංචිය ලබාදිය යුතුය.

ආ. ආනයන සඳහා පමණක් වන තාවකාලික ලියාපදිංචිය ලබා දීම

දැනට පවතින තාවකාලික වැට් ලියාපදිංචි ක්‍රියාවලියේදී පහත සඳහන් සීමාවන්ට යටත්ව ලියාපදිංචි සහතිකයක් නිකුත් කළ යුතුය.

1. ආනයන පහසුකම සඳහා ඉදිරිපත් කරනු ලබන ආනයන ඉන්වොයිසියට (Sale Invoice) පමණක් තාවකාලික වැට් බදු ලියාපදිංචිය සීමා විය යුතුය. ඒ අනුව එම ඉන්වොයිසියේ සඳහන් අංකය, භාණ්ඩ වර්ගය, ප්‍රමාණය සඳහන්ව ලියාපදිංචි සහතිකය නිකුත් කළ යුතුය.

2. ආනයනය කරනු ලබන්නේ රජයේ කාර්යයන් හෝ ව්‍යාපෘති සඳහා නම් (ව්‍යාපාරික අරමුණකින් නොවේ) එකී ආනයනයන්හි අවශ්‍යතාවය සලකා බලා තාවකාලික වැට් බදු ලියාපදිංචි පහසුකම නිශ්චිත ඉදිරි කාල වකවානුවක් දක්වා ලබාදිය හැක.

3. දැනට ඉදිරි සීමාවන් සඳහා නිකුත් කර ඇති ආනයන සඳහා වන තාවකාලික වැට් බදු ලියාපදිංචි සහතික 2024.04.24 දිනට පසුව අවලංගු කර, නව අයදුම්පත් සඳහා උක්ත 01 සහ 02 අනුව නව තාවකාලික වැට් ලියාපදිංචි සහතිකයක් නිකුත් නිරීම කළ යුතුය.

5.3.2 කඳහා ඇමුණුම

ඇමුණුම 05

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2378/33 - 2024 අප්‍රේල් මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2024.04.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත

145 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ වන නිවේදනය

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 145 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, විජේසිංහ ආරච්චිගේ සේපාලිකා චන්ද්‍රසේකර වන මා විසින්, බදු ගෙවීම් සිදුකළ යුතු ආකාරය මෙහි පහත සඳහන් 1 වැනි උපලේඛනය මගින් නිශ්චිතව දක්වනු ලැබේ.

විජේසිංහ ආරච්චිගේ සේපාලිකා චන්ද්‍රසේකර,
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

2024 අප්‍රේල් 01 වැනි දින,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,
කොළඹ 02.

1 වැනි උපලේඛනය

බදු ගෙවීම් කළ යුතු ආකාරය

මෙහි පහත සඳහන් ක්‍රම භාවිත කිරීම මගින් පමණක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත බදු ගෙවීම් කළ යුතු ය.

ඇ. මුදල් නැන්පත් කිරීම මගින්;

ආ. ගෙවීම් ඇණවුමක් හෝ බැංකු අණකරයක් නැන්පත් කිරීම මගින්;

ඇ. මාර්ගගත බදු ගෙවීමේ පහසුකම (OTPP) භාවිත කිරීම මගින්.

EOG 04 - 0035

1A - G 41712 — 05 (2024/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

5.3.3.(අ) ඇමුණුම

ඇමුණුම 06

Revenue Administration Management Information System - RAMIS - External Agency Interfacing as of 31st March 2024

අනු අංකය	ආයතනය	වර්තමාන තත්ත්වය - මාර්ගගතව සම්බන්ධවීමට නොහැකි වීමට හේතුව/හේතු
1	මහජන බැංකුව	දැනටමත් සම්පූර්ණ කර ඇත.(මාර්ගගත ගෙවීම් සිදු කිරීම සඳහා සම්බන්ධතාවය ලබා දී ඇත)
2	ලංකා බැංකුව	දැනටමත් සම්පූර්ණ කර ඇත.
3	ශ්‍රී ලංකා රේගුව	දැනටමත් සම්පූර්ණ කර ඇත. (මාර්ගගත ගෙවීම් සිදු කිරීම සඳහා සම්බන්ධතාවය ලබා දී ඇත)
4	මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය	දැනටමත් සම්පූර්ණ කර ඇත.
5	සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව	දැනටමත් සම්පූර්ණ කර ඇත.
6	ලංකා ක්ලියර් පුද්ගලික සමාගම	දැනටමත් සම්පූර්ණ කර ඇත.
7	ආගමන හා විගමන දෙපාර්තමේන්තුව	මේ පිළිබඳව සාකච්ඡා පවත්වා දත්ත සැපයීමට ඇති නීතිමය බාධා ඉවත් කර ගැනීම සඳහා ආගමන විගමන දෙපාර්තමේන්තුවේ නීතිමය පනතට අදාල සංශෝධන ගෙන ඒමේ කටයුතු සිදුකරමින් පවතී.ඊට අමතරව අවශ්‍ය දත්ත මොනවාද යන්න තීරණය කොට අවබෝධතා ගිවිසුම (MOU) කෙටුම්පත් කොට ඇති අතර අත්සන සඳහා සූදානම් කරමින් පවතී.
8	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පද්ධතිය ජාතික හැඳුනුම්පත් අංකය දත්ත ක්ෂේත්‍රයක් ලෙස (Data field) ඇතුළත් කොට දත්ත පද්ධතිය සංශෝධනය කිරීම නිමකොට ඇත. දත්ත හුවමාරු කිරීම සඳහා තාක්ෂණික පසුබිම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මඟින් සම්පූර්ණ කර ඇත. පරීශීලක පිළිගැනීමේ පරීක්ෂාව (UAT) සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇත.
9	ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව	මෙම දෙපාර්තමේන්තුව තුල දැනට RAMIS පද්ධතිය හා සම්බන්ධවීමට තරම් ප්‍රමාණවත් පරිෂ්කනක පද්ධතියක් නැත. RAMIS පද්ධතිය හා සම්බන්ධවීමට අවශ්‍ය තොරතුරු පරාමිතින් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. තවද RAMIS පද්ධතිය මඟින් ඔවුන්ට අවශ්‍ය තොරතුරු පරාමිතින් ලබා දෙන ලෙසටද ඉල්ලීම් කර ඇත.
10	සුරාබදු දෙපාර්තමේන්තුව	දැනටමත් පරිෂ්කනක පද්ධතියක් නොමැති වුවද mannual දත්ත එක් රැස්කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත එවීම සඳහා පහසුකම් සපයා ඇත. ඒ පිළිබඳව UAT නිම කොට ඇත. ඒ සඳහා අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සිදු වෙමින් පවතී.
11	පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව	දැනට බදු ගෙවන්නන් ලියාපදිංචි කිරීමේ කටයුත්ත සඳහා RAMIS පද්ධතියට සහ තොරතුරු අංශයට පුද්ගලයින්ගේ ජාතික හැඳුනුම්පත් තොරතුරු පරීක්ෂා කිරීම සඳහා තොරතුරු ලබා ගැනීමේ පහසුකම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ලබා ගෙන ඇත.
12	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව	ඉඩම් රෙජිසට්‍රාර් කාර්යාලයේ ඉඩම් වල අයිතිය හුවමාරුවීම සම්බන්ධ තොරතුරු ඇතුළත් පරිෂ්කනක පද්ධතියක් නොමැති බැවින් එවැනි පද්ධතියක් සකස් කරන තුරු පද්ධතිය සමඟ ඒකාබද්ධ කිරීමට නොහැකි වී ඇත. පද්ධතියට සම්බන්ධවීම සඳහා විකල්ප ක්‍රමයක් ලෙස තොරතුරු ලබා දීම සඳහා RAMIS වෙතින් අතුරු මුහුණතක් ලබා දීමට කටයුතු කරමින් පවතී.

5.3.3. (අ) සඳහා ඇමුණුම

ඇමුණුම 07

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මඟින් බදු ගෙවීම සඳහා මාර්ගගත පහසුකම් ලබා දී ඇති බැංකු

The List of the OTPP Member Banks

	Bank	Enabled Mode		
		Internet Banking	Mobile Banking	Over the Counter
1	Bank of Ceylon	√	-	√
2	People's Bank	√	-	√
3	Sampath Bank PLC	√	-	-
4	Commercial Bank of Ceylon PLC	√	-	-
5	National Savings Bank	√	-	√
6	Nations Trust Bank PLC	√	-	√
7	National Development Bank	-	-	√
8	Hatton National Bank PLC	√	√	-
9	Pan Asia Banking Corporation PLC	√	-	-
10	Union Bank of Colombo PLC	-	-	√
11	HSBC	√	-	-
12	Seylan Bank PLC	√	-	-
13	DFCC Bank PLC	-	-	√
14	SDB	-	-	√
15	Amana Bank	-	-	√
16	Cargills Bank	-	-	√

5.3.7. සඳහා යෝජනාව

ඇමුණුම 08

IRD Proposals

1. Proposals to reduce time limit within the Inland Revenue Department for appeals

Proposal

Reduction of the time available to the Commissioner General to review a request for administrative review (RAR) from tax returns to be submitted by taxpayers on or after 1 April 2024 to **six months.**

Justification for the proposal: According to the provisions of the Inland Revenue Act, No. 24 of 2017 (IRA) as amended, the Commissioner General of Inland Revenue (CGIR) has two years to make a decision for RAR and the taxpayer has the option to appeal to the Tax Appeals' Commission (TAC) before the decision of the CGIR, but after seven months have passed from the submission of the request. In practice the taxpayer may wait for the CGIR decision and appeals may take time to finalize and tax payments on assessments may be deferred. Accordingly, the Inland Revenue Department (IRD) agrees to reduce the time for six months. However, considering the appeals in hand at the moment with CGIR, above proposal is being made to introduce as a new amendment to the Inland Revenue Act No. 24 of 2017 (IRA) for RARs received for tax returns submitted after 01.04.2024.

Along with the above proposal**, additional Proposals** for streamlining the appeal process are also given below

Additional Proposal

i. If the CGIR has not given his decision within six months, the assessment should be prevailed for all purposes (RAR should not be time barred).
ii. Similar provisions should be introduced for all tax acts administered by CGIR

2. Proposals to reduce time limit within the Tax Appeals' Commission

Proposal

Limit the cases heard by the TAC only to issues relating to **"amounts" of assessments**. All legality or validity issues relating to assessments, including mixed issues (both issues on validity and amounts are disputed by the taxpayer), must be submitted to a tax court. Clear provisions should be introduced into the TAC Act by defining the scope of the TAC.

Further, proposed to reduce the time available to decide a tax appeal by TAC to **6 months**. However, if the TAC is unable to decide the appeal in time, the **decision of the CGIR or assessment should be prevailed**.

Further, 50% of the disputed tax (with penalty) shall be paid to the CGIR before an appeal is filed with the TAC, and if the appellant has not complied accordingly, the appeal shall be dismissed.

Justification for the proposal: This will facilitate the TAC to reduce the number of appeal hearings and also enable the taxpayer to get a decision on his appeal without delaying the payment of tax.

5.3.8 කදිය පුළුන්

ඇමුණුම 09

Please find the details is request by the Committee on Ways and means under the item No.04

Total number of field -28

Mandatory field -15

Force Registration- Mandatory field 5

S. No.	Key field	Requirement	Reason for the Capture
1	Applicant reference No.(NIC/Passport)	Mandatory	Main key
2	Full name of the applicant	Mandatory	Required for legal requirement
3	Name with initials	Mandatory	used for the communication
4	Date of birth	Mandatory	Required to identify for the age of the taxpayers
5	Country of birth	Mandatory	Required for the identify age of the Taxpayers
6	Gender	Mandatory	Currently required for the SDG requirement
7	Preferred language	Mandatory	Comply to the Language Policy of the country
8	Preferred mode of communication	Mandatory	Facilitate to taxpayer
9	Website URL	Non mandatory	If maintain the business can use
10	Dual citizenship	Non mandatory	Identify the citizenship
11	Source of income	Mandatory	Need to identify income generated sources
12	Profession	Mandatory	Need to collect the data for statistics and will be important to policy decision
13	Permanent address	Mandatory	Required for communication
14	Province/ District/Divisional secretariat/Grama niladhari divisions	Mandatory	Required for collect the statistics for the policy decision(this will be helpful to identify revenue and tax payer distribution geographically)
15	Residential Address	Mandatory	Required for communication
16	Email address	Mandatory	Required for communication
17	Mobile	Non mandatory	Required for the communication

18	Office	Non mandatory	Required for the communication
19	Home	Non mandatory	Required for the communication
20	Fax	Non mandatory	Required for the communication
21	Bank name	Non mandatory	Bank information capturing
22	Account No.	Non mandatory	Bank information capturing
23	Civil status	Non mandatory	Tax purpose important to identify relationship of the family.
24	Name of spouse	Non mandatory	Tax purpose important to identify relationship of the family.
25	NIC of spouse	Non mandatory	Required to create a family tree
26	TIN No. of spouse	Non mandatory	Required to create a family tree
27	Individual business	Non mandatory	Required to issue a VAT Certificate for the import and export as well as identify the business income of the individual person.
28	Purpose of registration	Mandatory	Required to identify

Under the forced registration process required fields is as follows:

NIC	Mandatory
Full Name (Eng)	Mandatory
Gender (M/F)	Mandatory
Date of birth (yyyy-mm-dd)	Mandatory But can create from NIC
Address	Mandatory
Email	Not Mandatory can use default email

5.3.11 කිඳහා යැමුනුම

යැමුනුම 10

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2334/21 - 2023 මැයි මස 31 වැනි බදාදා - 2023.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත

102 වන වගන්තිය යටතේ වන නිවේදනය

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ (මෙහි ඉන්මතු "දේශීය ආදායම් පනත" යනුවෙන් හඳුන්වනු ලබන) 102 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ ද කැමැත්ත ඇතිව ඉහත කී 102 වන වගන්තිය යටතේ මෙම නිවේදනයට පෙර ලියාපදිංචි වී ඇති තැනැත්තන් හැර මෙහි උපලේඛනයේ අ - කොටසෙහි හෝ ආ - කොටසෙහි සඳහන් වාසික තැනැත්තන් දේශීය ආදායම් පනතේ 102 වන වගන්තිය යටතේ ලියාපදිංචි විය යුතු අතිරේක තැනැත්තන් පන්ති ලෙසට නිශ්චිතව සඳහන් කරමින් මෙම නිවේදනය ප්‍රකාශයට පත් කරන ලදී.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 ක් වූ මැයි මස 31 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

අ - කොටස

2023 ජූනි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි;

(i) වෛද්‍ය ආඥාපනත (105 වන පරිච්ඡේදය) යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති වෘත්තිකයන්

(ii) 1959 අංක 23 දරන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයින්

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(iii) 2009 අංක 23 දරන පනත යටතේ සංස්ථාපිත ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයින්

(iv) 1968 අංක 17 දරන පනත යටතේ සංස්ථාපිත ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකයින්

(v) ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ සාමාජිකයින්

(vi) 1976 අංක 01 දරන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය පනත යටතේ සංස්ථාපිත ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ සාමාජිකයින්

(vii) 2007 අංක 20 දරන පනත යටතේ සංස්ථාපිත ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයන්ගේ ආයතනයේ සාමාජිකයින්

(viii) ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරුන්

(ix) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිය ව්‍යාපාර ලියාපදිංචි කර ඇති තැනැත්තන්

(x) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙහි වාහන ලියාපදිංචි කර ඇති (ත්‍රී රෝද රථ, යතුරු පැදි සහ අත් ට්‍රැක්ටර් හැර) වාහන හිමිකරුවන්

(xi) 2018 අප්‍රේල් 01 වැනි දින හෝ ඊට පසු ශ්‍රී ලංකාවේ ඕනෑම නිශ්චල දේපළක් මිලදී ගත් හෝ පැවරුම් ඔප්පුවක් යටතේ අත්පත් කරගත් තැනැත්තන්

(xii) ඕනෑම සේවක අර්ථ සාධක අරමුදලක් සඳහා සේවා දායකයාගේ සහ සේවා යෝජකයා යන දෙපාර්ශවයේම මාසික දායකත්වයෙහි එකතුව රුපියල් 20,000/- ඉක්මවන සේවකයින්

(xiii) පළාත් පාලන ආයතනයකින් ගොඩනැගිලි සැලැස්මක් සඳහා අනුමැතිය ලබා ගන්නා ඕනෑම පුද්ගලයෙක්

(xiv) ශ්‍රී ලංකාවේ දී ඕනෑම සේවාවක් සැපයීම තුලින් මසකට රුපියල් 100,000/- ක් හෝ මාස දොළහක් සඳහා රුපියල් 1,200,000/- කට වඩා ගෙවීමක් ලබන වෙනත් ඕනෑම පුද්ගලයෙක්

ආ - කොටස

2024 ජනවාරි මස 01 සිට බලපැවැත්වෙන පරිදි, ඉහත අ කොටසෙහි කිසිදු කාණ්ඩයකට අයත් නොවන ඕනෑම පුද්ගලයෙක් සහ ;

(i) 2023 දෙසැම්බර් මස 31 වැනි දිනට වයස අවුරුදු 18 හෝ ඊට වැඩි සියළු පුද්ගලයින් හෝ

(ii) 2024 ජනවාරි මස 01 වැනි දිනට හෝ එදිනට පසු වයස අවුරුදු 18 සම්පූර්ණ වන පුද්ගලයින් වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පසු

EOG 05 - 0268

රේගු දෙපාර්තමේන්තුව		
අංකය	නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ගය
6.3.1	විශේෂයෙන්ම වාර්ෂික ආදායමෙන් සැලකිය යුතු කොටසක් ලෙස ගැනෙන 25%ක් වන මෝටර් රථ ආනයනය නොකිරීම හේතුවෙන්, ශ්‍රී ලංකා රේගුවේ ආදායම් උත්පාදනය ඉහළ නැංවීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගැනීම නිර්දේශ කරනු ලැබේ. අ) කාර්යක්ෂම රේගු ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම. ආ) ආදායම් කාන්දුව අවම කිරීමට රේගු මෙහෙයුම්වල නිරවද්‍යතාව සහ වේගය වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණය භාවිතා කිරීම. ඇ) වැරදි භාණ්ඩ වර්ගීකරණය, අඩුවෙන් තක්සේරු කිරීම සහ ජාවාරම් කිරීම ඇති විය හැකි ආදායම් අවදානම් හඳුනාගෙන ඒවාට විසඳුම් සෙවීම සඳහා ශක්තිමත් අවදානම් කළමනාකරණ පද්ධති ක්‍රියාත්මක කිරීම. ඈ) තොරතුරු සහ බුද්ධිය හුවමාරු කර ගැනීම සඳහා අනෙකුත් රාජ්‍ය ආයතන සමග සහයෝගීතාවය වර්ධනය කිරීම.	ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ අවදානම් කළමනාකරණ අංශය මගින් මේ වනවිටත් ස්වයංක්‍රීය අවදානම් කළමනාකරණ පද්ධතියක් (Automated Risk Management System) වැඩිදියුණු කරමින් පවතින අතර, එහි මූලික ක්‍රියාකාරී පද්ධතිය (Prototype) කටයුතු මේ වනවිටත් අවසන් අදියරේ පවතී. එය යෙදවුමක් වශයෙන් ASYCUDA පද්ධතිය සමග සබැඳිව ක්‍රියාකිරීමට අවශ්‍ය තොරතුරු තාක්ෂණික විසඳුම (IT Solution) සකස් කිරීම සඳහා ASYCUDA පද්ධතිය හඳුන්වා දී ඇති UNCTAD ආයතනය සමග මූලික සාකච්ඡා ආරම්භ කර ඇති අතර, ඒ සඳහා තාක්ෂණික කමිටුවක් ද මේ වන විට පත්කර ඇත. මෙම ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීම තුළින් අ, ආ, ඇ යන කරුණුවලට විසඳුම් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මුදල් අමාත්‍යාංශයේදී සතිපතා පවත්වනු ලබන ආදායම් කළමනාකරණ සහ මුදල් ප්‍රවාහ විශ්ලේෂණ රැස්වීමේදීද (Revenue Management & Cash Flow Analysis Meeting) මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරනු ලබයි. ස්වයංක්‍රීය අවදානම් කළමනාකරණ පද්ධතියට අදාළ වැඩි දියුණු කිරීම සඳහා UNCTAD ආයතනය සමග මේ වන විට සාකච්ඡා පවත්වන අතර, එම තීරණය ඉදිරියේදී දැනුම් දීමට නියමිතය. එසේම, දේශීය සමාගම් සමගද ස්වයංක්‍රීය අවදානම් කළමනාකරණ පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය සාකච්ඡා කරමින් පවතී.
6.3.2.	වෙනස්වන ගෝලීය වෙළඳ ප්‍රවණතාවලට අනුවර්තනය වීම සඳහා තීරුබදු ප්‍රතිපත්තිය නිතිපතා සමාලෝචනය කරමින් හා යාවත්කාලීන කරමින් ප්‍රධාන දේශීය කර්මාන්ත ආරක්ෂා කරන අතර ආර්ථික වර්ධනය, තරඟකාරිත්වය සහ තිරසාර සංවර්ධනය සඳහා සක්‍රීය පරිසරයක් නිර්මාණය කිරීම අරමුණු කරගත් මනා සමතුලිත ජාතික තීරුබදු ප්‍රතිපත්තියක් සකස් කිරීමටත් ක්‍රියාත්මක කිරීමටත් නිර්දේශ කෙරේ.	ලෝක වෙළඳ සංවිධානය මඟින් ක්‍රියාත්මක කරන ලද වෙළඳ පහසුකම් සැලසීම සඳහා වූ ගිවිසුම් ප්‍රකාරව ඇති මිනුම්දඬු ළඟාකර ගැනීම සඳහා රජයේ වෙනත් දේශසීමා නියෝජිත ආයතන, පෞද්ගලික ආයතන හා දායක නියෝජිත ආයතන සම්බන්ධීකරණය කරගනිමින් ජාතික වෙළඳ පහසුකම් සැලසීමේ කමිටුවට අදාළව කටයුතු සිදු කෙරේ. වඩාත් විනිවිදභාවයකින් යුක්ත වූ ස්ථාවරභාවයකින් කටයුතු කරන සහ වගවීම යන කරුණු මුල් කර ගත් ජාතික තීරුබදු ප්‍රතිපත්තිය සකස් කිරීමෙන් පසුව, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට මුදල් අමාත්‍යාංශය කටයුතු කර ඇති අතර, ඒ අනුව 2024 ජූනි මස 11 දින අමාත්‍ය මණ්ඩලය විසින් ජාතික තීරු බදු ප්‍රතිපත්තිය අනුමත කර ඇත.

6.3.3.	අපනයන ආදායම ඉහළ නැංවීම සඳහා ගනු ලබන පියවරක් ලෙස රටේ තීරුබදු ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම සහ යාවත්කාලීන කිරීම නිර්දේශ කෙරේ.	අමාත්‍ය මණ්ඩලය විසින් 2024 ජූනි මස 11 දිනයෙන් අනුමත කර ඇති ජාතික තීරුබදු ප්‍රතිපත්තියට අනුකූලව, දැනට පවතින අපනයන බදු සරල කිරීම හෝ ඒවා ඉවත් කිරීමට සහ එමගින් අපනයනයන් ප්‍රවර්ධනයටත් අවශ්‍ය කටයුතු කරනු ලැබේ.
6.3.4.	ආනයන/අපනයන ක්‍රියාපටිපාටි සරල කිරීම, විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම, ආනයනවල සමස්ත පිරිවැය අඩු කිරීම සහ අපනයනවල ගෝලීය තරඟකාරිත්වය ඉහළ නැංවීම යන අරමුණු ඇතිව අතුරු තීරුබදු ඉවත් කිරීම නිර්දේශ කෙරේ.	2023 අයවැය මගින් යෝජනා කරන ලද පරිදි, අපනයනය මුල් කරගත් වෙළඳාම පුළුල් කිරීම සඳහා තීරුබදු නොවන අනෙකුත් ආනයන බදු (Para Tariff) ඉවත් කිරීමේ මුල් අදියර 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී. ජාතික තීරුබදු ප්‍රතිපත්තියේ ආවරණයන්ට යටත්ව අපනයනයන් වැඩිදියුණු කිරීමේ සරල සහ විනිවිදභාවයෙන් යුතු තීරුබදු ප්‍රතිපත්තියක් පවත්වා ගැනීමට කටයුතු කරනු ලැබේ.
6.3.5	භාණ්ඩ ආනයනය සහ අපනයනය සඳහා ඒකාබද්ධ ඩිජිටල් වේදිකාවක් ක්‍රියාත්මක කිරීම නිර්දේශ කෙරේ.	ශ්‍රී ලංකා රේගුව විසින් භාණ්ඩ ආනයනය සහ අපනයනය සඳහා ASYCUDA World පද්ධතිය ක්‍රියාත්මක කර ඇත. සියලුම භාණ්ඩ ආනයන හා අපනයන ක්‍රියාවලිය මෙම පද්ධතිය හරහා සිදු කෙරේ. නිරෝධායන කටයුතු, ආනයන පාලක බලපත්‍රය යනාදී අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම පද්ධතිය දේශසීමා (Boarders) ආයතන සම්බන්ධ කර ඇත. මෑතකදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ASYCUDA World පද්ධතියට සම්බන්ධ විය. දැනටමත් මෙම පද්ධතිය සඳහා ආයතන 18ක් සම්බන්ධ වී ඇත. කෙසේ වෙතත්, මෙම නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා National Single Window ව්‍යාපෘතිය, මුදල් අමාත්‍යාංශය මඟින් දැනටමත් ආරම්භ කර ඇත. ඒ අනුව ව්‍යාපෘති ඒකකයක් ස්ථාපිත කරන ලදී.
6.3.6.	රාජසන්තක වූ භාණ්ඩ වෙන්දේසි කිරීමෙන් උපයන අරමුදල් තැන්පත් කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම නිර්දේශ කරනු ලබන අතර, අවශ්‍ය නම්, ඒ සඳහා පහසුකම් සැලසීම සඳහා නීතිමය සංශෝධන හඳුන්වා දීම නිර්දේශ කෙරේ.	දැනටමත් ක්‍රියාත්මක කර ඇත. රාජසන්තක භාණ්ඩ වෙන්දේසි කිරීමෙන් අනතුරුව රේගු ආඥා පනතේ 153 වගන්තිය අනුව කටයුතු කරනු ලබයි. (ඇමුණුම 11)

6.3.7.	නීතිවිරෝධී ලෙස ශ්‍රී ලංකාවට ගෙන එන රත්‍රන් සහ ග්‍රෑම් 100 / රන් පවුම් 12.5 ට වැඩි රත්‍රන් හා වෙනත් වටිනා භාණ්ඩ සඳහා ත්‍රිත්ව වටිනාකමකින් යුත් දඩයක් නියම කිරීම නිර්දේශ කෙරේ.	මේ සම්බන්ධව ගරු නීතිපතිතුමාගේ මතය විමසා ඇත. (ඇමුණුම 12) රේගු ආඥා පනතේ වගන්ති අංක 101 ප්‍රකාරව විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතුව ඇත.
6.3.8.	ශ්‍රී ලංකාවට රත්‍රන් ගෙන ඒම සඳහා සීමාවක් පැනවීම (ග්‍රෑම් 100 / රන් පවුම් 12.5) සහ රාජසන්තක කරන ලද රත්‍රන් / මෙම සීමාව ඉක්මවන රත්‍රන් හා වටිනා භාණ්ඩ සඳහා ත්‍රිත්ව වටිනාකමකින් යුත් දඩයක් නියම කිරීම නිර්දේශ කෙරේ.	
6.3.9.	තම දරුවන් සඳහා කුඩා රත්‍රන් ප්‍රමාණයක් රැගෙන යන මැදපෙරදිග සිටින ශ්‍රී ලාංකික සේවකයින්ට අපහසුතාවයක් ඇති කිරීම වළක්වා ගැනීම නිර්දේශ කෙරේ. ඒ වෙනුවට, ඉහත ජාවාරම්කරුවන් විසින් ගෙන එන රත්‍රන් රාජසන්තක කරන ලෙස යෝජනා කරනු ලැබේ. ඔවුන් නිතර මෙරටින් යෑම හා ආපසු ඒම සිදු වන බැවින්, ඔවුන්ගේ විදේශ ගමන් බලපත්‍ර පරීක්ෂා කිරීමෙන් එය තහවුරු කළ හැකි කරුණකි.	ජාතික තීරු බදු ප්‍රතිපත්තිය මගින් මේ පිළිබඳ තීරණය ගැනීමට නියමිතය.
6.3.10.	ශ්‍රී ලංකාවේ කරුංකා වෙළඳාම නියාමනය කිරීම, වෙළඳාමේ තිරසාර බව සහතික කිරීම සහ නීතිවිරෝධී කරුංකා පුවක් ආනයනය මැඩපැවැත්වීම සඳහා රේගු සහ දේශසීමා පාලන පියවර වැඩි දියුණු කිරීම නිර්දේශ කෙරේ.	ජාත්‍යන්තර කරුංකා වෙළඳාම පිළිබඳව රේගු දෙපාර්තමේන්තුවේ විශේෂ අවධානය යොමු වී ඇති අතර, නීතිවිරෝධී කරුංකා ආනයනය වැළැක්වීම සඳහා අවදානම් කළමනාකරණ පද්ධතියෙහි අවශ්‍ය වැඩිදියුණු කිරීම් දැනටමත් සිදුකර ඇත. උදාහරණයක් ලෙස, කරුංකා ආනයන සිදු කරන ලද අවසන් නැවගත කිරීම් හා ප්‍රතිනැවගත කිරීම්වලට අදාළ තොරතුරු විශ්ලේෂණයන් සඳහා භාවිතා කෙරේ.
6.3.11	බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, කොළඹ වරාය (නව බහාලුම් පර්යන්ත ඒකකය) සහ ශ්‍රේණිගත බහාලුම් පර්යන්තයේ පිරික්සුම් අංගනයේ ස්කෑනර් යන්ත්‍ර සඳහා කෘතිම බුද්ධි (AI) තාක්ෂණය හඳුන්වා දීම නිර්දේශ කෙරේ.	මෙම නිර්දේශය මගින් පෙන්වා ඇති ස්ථානවල දැනට භාවිතයට ගනු ලබන ස්කෑන් පද්ධති සමග කෘතිම බුද්ධිය (AI) තාක්ෂණය ඒකාත්මික කර ක්‍රියාත්මක වීමේ ඇති තාක්ෂණික හැකියාව හා ඒ සඳහා වන පිරිවැය පිළිබඳව අදාළ අංශ සමග කරුණු සාකච්ඡා කර ශ්‍රී ලංකා රේගුව විසින් ඉදිරි කටයුතු සැලසුම් කරමින් පවතී.

6.3.12	ඇතැම් රාජ්‍ය ආයතන තාක්ෂණික ක්‍රම හරහා වැරදි ඉන්වොයිසි කිරීම්වල නිරත වන බැවින් ජාත්‍යන්තර වෙළඳ ප්‍රජාවගේ සහාය ඇතිව ගුවන් තොටුපළවල සහ වරායන්හි වැරදි ඉන්වොයිසි කිරීම් අවම වශයෙන් 50% කින් අඩු කිරීම නිර්දේශ කෙරේ.	අවදානම් කළමනාකරණ අංශය මගින් දැනට ගොඩනගමින් පවතින අවදානම් කළමනාකරණ පද්ධතිය (RMS), ජාතික ආනයන මිල දත්ත පද්ධතිය හා ඉදිරියේදී ක්‍රියාවට නැංවීමට නියමිත ASYHUB පද්ධතිය ක්‍රියාත්මක කිරීම තුළින් මෙකී නිර්දේශයට අදාළ ප්‍රතිඵල අපේක්ෂා කරනු ලැබේ.
6.3.13	ගෝලීය මූල්‍ය සුපිළිපන්න බව පිළිබඳ වාර්තාවේ (Global Financial Integrity Report) දක්වා ඇති වැරදි ඉන්වොයිස් කිරීම සහ මිල හුවමාරු කිරීම වැළැක්වීම සඳහා වන ක්‍රියාමාර්ග ASYCUDA පද්ධතියට ඇතුළත් කිරීම හා පද්ධතියේ ආවේණික ලක්ෂණයක් ලෙස මෙම ක්‍රමවේදය ඒකාබද්ධ කිරීම සඳහා ASYCUDA පද්ධතිය වැඩි දියුණු කිරීම නිර්දේශ කෙරේ. **වැරදි ඉන්වොයිස් කිරීම මගින් රටට අහිමි වන විදේශ විනිමයෙන් අඩක් ඉතිරිකර ගත හැකි නම් මෙරට ගෙවුම් ශේෂ අර්බුදය විසඳා ගැනීමට එයින්ම හැකියාවක් ඇත.**	එසේම තාවකාලික VAT අංක ලබා දීම (2525) මගින් රජය වෙත ලැබිය යුතු බදු මුදල් අහිමි වීම වළක්වා ගැනීමට දැනටමත් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඒ සඳහා අනුමැතිය ලබාගෙන ඇත. ඒ අනුව, මේ වන විට එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
6.3.14	ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය ඇතුළු ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ එක්ව ජාත්‍යන්තර වෙළෙඳාමේ මිල හුවමාරු කිරීමේ ගැටලුවලට අමතරව වැරදි ඉන්වොයිසි කිරීමේ අභියෝග විසඳීමට සහයෝගී ක්‍රියාමාර්ග ගැනීම නිර්දේශ කෙරේ.	ජාත්‍යන්තර වෙළඳාම්වලට අදාළව සිදුවන අක්‍රමිකතා හා වැරදි ඉන්වොයිස්ගත කිරීම මඟින් රජය වෙත අහිමි වන ආදායම් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හා මුදල් අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව ක්‍රියාකාරී සැලැස්මක් (Action Plan) සකස් කර ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට මුදල් අමාත්‍යාංශය මූලිකව කටයුතු සිදු කරමින් කමිටුවක් පත් කර ඇත. මේ සඳහා, ශ්‍රී ලංකා රේගුව සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ එක්වී දත්ත හුවමාරු කර ගැනීම මගින් සිදුවන අක්‍රමිකතා සහ වැරදි ඉන්වොයිස්ගත කිරීම් සම්බන්ධ විමර්ශන සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගත හැක. එමගින් ඉදියේදී එවැනි අක්‍රමිකතා අවම කර ගැනීමට හැකියාව ඇත.

6.3.15	බදු සංශෝධන මගින්, විවිධ ජන කොටස්වලට ධනාත්මක සහ සෘණාත්මක බලපෑම් ඇති කළ හැකි බැවින් එමගින් නිශ්චිත පුද්ගලයින් කණ්ඩායම්වලට අසාධාරණ ලාභ හෝ සැලකිය යුතු අලාභ ලැබීම වැළැක්වීම සඳහා ඒවායේ ප්‍රතිවිපාක පිළිබඳ මනා විද්‍යාත්මක ඇගයීමක් සහ විශ්ලේෂණයකින් පසුව පමණක් මුදල් අමාත්‍යාංශය මගින් බදු සංශෝධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම නිර්දේශ කෙරේ.	2024 ජූනි මස 11 දිනැතිව ජාතික තීරුබදු ප්‍රතිපත්තිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, ඒ අනුව, ඉදිරියේදී බදු සංශෝධනයන් සිදු කිරීමට මුදල් අමාත්‍යාංශය විසින් කටයුතු කරනු ලැබේ.
6.3.16	නිවැරදි ආනයන අගයන් ස්වයංක්‍රීයව නිර්ණය කිරීමට හැකිවන පරිදි යාවත්කාලීන සහ විශ්වාසනීය තක්සේරු දත්ත පද්ධතියක් පවත්වා ගැනීම නිර්දේශ කෙරේ.	ඉහත 6.3.13 ට අදාළව ඉදිරිපත් කළ පිළිතුර අදාළ වේ. ස්වයංක්‍රීය අවදානම් කළමනාකරණ පද්ධතිය මගින් වැරදි ආනයන අගයන් හඳුනා ගත හැකිය.
6.3.17	විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඇමෙරිකානු ඩොලරයට අනුරූපිව පවත්වාගෙන යාමට නිර්දේශ කෙරේ.	විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ක්‍රියාත්මක කිරීම 2025 ජනවාරි මස 01 දින සිට බලාත්මක නොකිරීමට 2024 මාර්තු මස 25 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බැවින් ඉදිරියේදී ඒ අනුව කටයුතු සිදු කරනු ලැබේ.
6.3.18	ආනයනික අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල ආනයනකරුවන්ට හා වෙළෙන්දන්ට ඒවායේ මිල ගණන් අත්තනෝමතිකව ඉහළ දැමීම වැළැක්වීම සඳහා ඒවායේ රක්ෂණ බහාලුම් පිරිවැය, විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ අගය හා මෙම භාණ්ඩවල වෙළඳපොල මිල ගණන් (කිලෝග්‍රෑමයකට) (කොළඹ හා දඹුල්ලේ) පාරිභෝගික කටයුතු අධිකාරියේ සහයෝගිත්වයෙන් ප්‍රසිද්ධ කිරීම.	ශ්‍රී ලංකා රේගුව පාරිභෝගික කටයුතු අධිකාරිය සමඟ දත්ත හුවමාරු කිරීම සිදු කරන අතර, ඒ අනුව අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩවල මිල ගණන් රේගු වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කිරීමට දැනටමත් කටයුතු කරමින් පවතී.
6.3.19	ශ්‍රී ලංකා රේගුව විසින් සකසන ලද, ආනයනික ආහාර ද්‍රව්‍ය සහ ඉන්ධන ඇතුළු භාණ්ඩවල බදු පැනවීමෙන් පසු පිරිවැය විස්තර කෙරෙන වාර්තාව සෑම මාසයකම ශ්‍රී ලංකා රේගුවේ සහ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු වෙබ් අඩවි හරහා ප්‍රකාශයට පත් කිරීම නිර්දේශ කෙරේ.	පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් මිල ගණන් ප්‍රකාශයට පත් කරනු ලබයි. ඉදිරියේදී ඉන්ධන මිල ගණන් ද ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කරමින් පවතී.

6.3.6. සඳහා ඇමුණුම
ඇමුණුම 11

අරමුදලේ මුදල් යොදවා ගත හැකි කාර්ය
(79, 1988 අංක 83)
(83, 1988 අංක 83)

153අ(1) අරමුදලේ මුදල් පහත දැක්වෙන කාර්යයන් සඳහා උපයෝගී කරගත යුතුය:-

(අ) රේගුව කළමණාකරණයෙහි සඵලතාව වැඩි දියුණු කිරීම පිණිස රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට පෙනී යන පහසුකම් සලසා දීම; සහ

(ආ) ස්ථිර වශයෙන් හෝ පූර්ව වශයෙන් හෝ අර්ධ වශයෙන් අබල වූ හෝ තාවකාලිකව අශක්තුතාවයකට පත් වූ විට යම් රේගු නිලධරයෙකුට වන්දි මුදල් ලබාදීම හෝ යම් රේගු නිලධරයෙකු මිය ගිය විට ඔහුගේ නීත්‍යානුකූල උරුමක්කාරයන්ට වන්දි මුදල් ලබාදීමත්; කෙසේ වෙතත් අවස්ථාවෝචිත පරිදි, එම අබලතාව, අශක්තුතාව හෝ මරණය සිදු වූයේ පහත සඳහන් තුවාලයක් නිසා විය යුතුය:-

(i)ඒ නිලධාරියා රාජකාරියේ යෙදී සිටිය දී සිදු වූ තුවාලයක්; හෝ

(ii)ඒ නිලධරයා-

(අ) රාජකාරියට වාර්තා කිරීම සඳහා සිය

වාසස්ථානයේ සිට සිට සේවා ස්ථානයට යමින් සිටිය දී සිදු වූ තුවාලයක්; හෝ

(ආ) රාජකාරියෙන් පසුව සිය සේවා ස්ථානයේ සිට සිය වාසස්ථානය කරා යමින් සිටිය දී සිදු වූ තුවාලයක්; හෝ

(iii) ඒ නිලධාරියා රාජකාරියේ යෙදී නොසිටිය දී තමාගේ සාමාන්‍ය රාජකාරී කටයුතුවල විෂය පථයට ගැණෙන යම් ක්‍රියාවක් ඉටු කිරීමේ දී සිදු වූ තුවාලයක්; හෝ

(iv) තමාගේ රාජකාරී කටයුතු ක්‍රියාත්මක කිරීමෙහි ලා ඉටු කරන ලද ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන් ඒ නිලධාරියාට සිදු වූ තුවාලයක්; හෝ

(v) තම රාජකාරී කටයුතු ඉටු කිරීමෙහි ලා ඒ නිලධාරියා විසින් ගන්නා ලද යම් ක්‍රියා මාර්ගයක් නිසා ඇති වූ හෝ පැන නැඟුන යම් පළිගැනීමේ ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන් ඔහුට සිදු වූ තුවාලයක් හෝ,

(83, 1988 අංක 83)

(2) ඒ වන්දි මුදල් ලබා දෙන්නේ යම් ප්‍රතිපත්ති සහ කොන්දේසිවලට යටත් ව ද, ඒ ප්‍රතිපත්ති සහ කොන්දේසි සඳහා ද එවැනි අරමුදලක් පිහිටුවීම සහ

ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන සියලු කරුණු සඳහා ද අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියෝග මඟින් විධි විධාන සළස්වනු ලැබිය හැකිය.

(3) රේගු නිලධරයකුගේ අබලතාව, අශක්තතාව හෝ මරණය සම්බන්ධයෙන් මේ වගන්තියේ ඉහතින් වූ විධි විධාන යටතේ සාදනු ලැබූ නියෝගවලට අනුව දෙනු ලබන යම් වන්දි මුදලක්, විශ්‍රාම වැටුප් සංග්‍රහය හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ එවැනි අබලතාවක්, අශක්තතාවක් හෝ මරණයක් සම්බන්ධයෙන් දෙනු ලබන යම් විශ්‍රාම වැටුපකට, පාරිතෝෂිකයකට, වන්දි මුදලකට, දීමනාවකට හෝ වෙනත් ප්‍රතිලාභයකට අමතරව විය යුතුය.

154(1) මේ ආඥා පනත යටතේ අභිමි කරන ලද සේ තහනමට ගනු ලැබූ හෝ මින් මතු එසේ තහනමට ගනු ලබන සියලු නැව්, බෝට්ටු, භාණ්ඩ සහ වෙනත් දේ, තහනමට ගනු ලැබුවේ යම් තැනැත්තෙකුගෙන් ද, එම තැනැත්තා හෝ ඒවායේ අයිතිකරු හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තෙකු හෝ විසින් පෙර කී පරිදි තහනමට ගනු ලැබූ නැව, බෝට්ටුව, භාණ්ඩ හෝ වෙනත් දේ සම්බන්ධයෙන් හිමිකම් පෑමක් කිරීමට තමා අදහස් කරන බවට ඒවා තහනමට ගනු ලැබූ දින සිට මාසයක් ඇතුළත ළඟම පිහිටි වරායේ රේගු අධ්‍යක්ෂ

තහනමට ගත් භාණ්ඩ, මාසයක දී ඒවාට හිමිකම් පෑමක් නොලදහොත් නුසුදුසු බවට ප්‍රකාශ කොට ඒවා සම්බන්ධයෙන් ඒ අනුව ක්‍රියා කළ යුතු බව (29, 1974 අංක 35)

 6.3.7, 6.3.8 සහ 6.3.9 ඡේදය 12

CUS/LA/AG/ADV/2023/10

15.11.2023

URGENT

Hon. Attorney General,
Attorney General's Department,
Colombo 12.

Directives given at the meeting of the Committee on Ways and Means held on 08.11.2023.

This has reference to the letter dated 10.11.2023 received from Deputy Principal Officer, Committee on Ways & Means on captioned matter (Copy Attached).

Following directives were given by Hon. Patali Champika Ranawaka, Chair of the Committee as quoted below to the Director General of Customs to implement within certain period of time.

1. To impose a fine of triple value for gold and other valuable items of more than 100g illegally brought in to Sri Lanka (On or before 20th November 2023).
2. To impose a ceiling to bring gold to Sri Lanka (100g / 12.5 gold sovereign) and impose the fine of triple value to the forfeited gold / valuables exceeding this ceiling (On or before 31st December 2023).

I wish to be advised as to whether

a. Directives 1. & 2. above are in conformity with the existing provisions of the Customs Ordinance and
b. If the answer to a) is in the affirmative, the Director General of Customs is required to comply with those directives disregarding grounds for mitigation.

Your early reply in this regard is greatly appreciated

P.B.S.C Nonis
Director General of Customs

11/12 2023 21:52 FAX 001

ශ්‍රී ලංකා රේගුව
අංක 40, ප්‍රධාන වීදිය, කොළඹ 11
12 DEC 2023

මගේ අංකය
எனது இல.
My No. F/467/2023

ඔබේ අංකය
உமது இல.
Your No. CUS/LA/AG/ADV/2023/10

தபால் பெட்டி 502
P.O. Box No.

சுபாதிபதி 12.
கொழும்பு 12.
Colombo 12.

நீதிபதி දෙපාර්තමේන්තුව
சட்டமா அதிபர் திணைக்களம்
ATTORNEY - GENERAL'S DEPARTMENT

தொலைபேசி இல.
Telephone Nos. 2147888, 2433967, 2320800, 2327919, 2149001(2)

2023.12.08

மின் அஞ்சல்
E-mail administration@attorneygeneral.gov.lk

தொலைநகல்
Fax 2436421

495

RECEIVED
11 DEC 2023
D. G. C.
139

P.B.S.C. Nonis,
Director General of Customs,
Sri Lanka Customs,
Customs House, No. 40, Main Street,
Colombo 11.

① ADhc(HR) 11/12

Directives given at the meeting of the Committee on Ways and Means held on 08.11.2023

I refer to your letter dated 15th November, 2023 and the material annexed thereto.

Having considered the material made available I observe as follows:

At the outset it may be noted that the Committee on Ways and Means is mandated in terms of Standing Order 124 to recommend measures necessary to mobilize additional revenue for the Government and to consider its expenditure in strengthening the economic stability of the Country.

Having regard to the recommendation at Annexure 1, which makes no specific reference to a particular instance, the Director General of Customs would be required to take cognizance of the provisions of the Customs Ordinance., in exercising his discretionary powers having regard to the facts and circumstances of each case. In this context, attention is drawn *inter alia* to Sections 129,163 and 166B of the Customs Ordinance, which must be read with any other applicable provisions as may be relevant to the particular situation under consideration.

Amsara Gajadeera
StateCounsel

Sgd/ Kanishka de Silva Balapatabendi
Deputy Solicitor General
for Attorney General

සුරාබදු දෙපාර්තමේන්තුව		
අංකය	නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ගය
7.3.1	පහත සඳහන් සංරචක ඇතුළත් කරමින් සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා ආදායම් පරිපාලන පද්ධතිය (RASED) නම් තොරතුරු තාක්ෂණ යෙදුම සැකසීම කඩිනම් කිරීම.	RASED පද්ධතිය ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ අතිරේක ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් මුදල් අමාත්‍යාංශයේදී 2024.04.29 දින පැවති රැස්වීමේදී RASED පද්ධතිය සංවර්ධනය කිරීම උදෙසා සේවා දායකයෙකු විවෘත ප්‍රසම්පාදන ක්‍රමය යටතේ තෝරා ගැනීමට කටයුතු කරන ලෙසත් ඒ සඳහා ප්‍රසම්පාදන ලියකියවිලි සකස් කිරීම උදෙසා ප්‍රසම්පාදන විශේෂඥයෙකුගේ සහය ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් උපදෙස් ලබා දෙන ලදී. අදාළ සාකච්ඡා සටහන මේ සමග අමුණා ඇත. **(ඇමුණුම 13)** ඒ අනුව විවෘත ප්‍රසම්පාදන ක්‍රමය යටතේ ප්‍රසම්පාදන විශේෂඥයෙකු තෝරා ගැනීම සඳහා අවශ්‍ය මූලික ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී. ඊට අදාලව පත්කළ යුතු දෙපාර්තමේන්තු උපදේශන ප්‍රසම්පාදන කමිටුව 2024.05.31 දින පත්කර ඇත.
	• යම් මත්පැන් නිෂ්පාදකයෙකු කිසියම් වරදක් සිදු කර ඇත්නම් (බදු නොගෙවීම හෝ ව්‍යාජ ආරක්ෂිත බදු මුද්‍රාව සහිත මත්පැන් බෝතල් නිෂ්පාදනය කිරීම වැනි) එම මත්පැන් නිෂ්පාදකයාගේ මත්පැන් බලපත්‍රය ස්වයංක්‍රීයව අවලංගු කිරීමට.	RASED පද්ධතියේ හඳුනාගෙන ඇති Workflow හා Rule Engine මොඩියුල් ක්‍රියාත්මක කිරීමෙන් මෙම අවශ්‍යතාවය සපුරාගත හැකිය.
	• මාර්ගගත ක්‍රමය ඔස්සේ මත්පැන් බලපත්‍ර අලුත් කිරීමට.	RASED පද්ධතියේ හඳුනාගෙන ඇති License මොඩියුලය මගින් මාර්ගගත ක්‍රමය ඔස්සේ නව මත්පැන් බලපත්‍ර නිකුත් කිරීමටත් පවතින මත්පැන් බලපත්‍ර අලුත් කිරීමටත් හැකියාව ලැබෙනු ඇත.
	• අනෙකුත් අදාළ ආයතන සමඟ සම්බන්ධ කරමින් ඒකාබද්ධ ආදායම් කළමනාකරණ පද්ධතිය සමඟ එය ඒකාබද්ධ කිරීමට.	සුරාබදු දෙපාර්තමේන්තුවේ සේවාදායකයන් 24 ක් පමණ මේ වනවිට හඳුනාගෙන ඇත. දත්ත හුවමාරු අවශ්‍යතාවය හා හුවමාරු කළ යුතු දත්ත මේ වන විට හඳුනාගෙන ඇත.
	• අනන්‍ය හැඳුනුම් අංකය ලෙස ජාතික හැඳුනුම්පත් අංකය භාවිතා කිරීමට.	සමාගම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අනන්‍ය හැඳුනුම් අංකය ලෙස ජාතික හැඳුනුම්පත් අංකය භාවිතා කිරීමේ හැකියාව නොමැත. ජාතික ප්‍රතිපත්තියක් යටතේ මෙම අවශ්‍යතාවය නිශ්චිත ක්‍රමවේදයක් හමුවේ අනිවාර්ය කළහොත් මෙම නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ හැකියාව පවතී.

	• මෙම තොරතුරු තාක්ෂණ යෙදුම කළමණාකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ආකෘතිය (PPP ආකෘතිය) භාවිතා කිරීමට හැකි වීම.	RASED පහත සඳහන් පරිදි රාජ්‍ය හා පෞද්ගලික ආයතන සමග ක්‍රියාවට නැගීමට නියමිතය. ❖ RASED ව්‍යාපෘතියේ මෘදුකාංග සංවර්ධනය හා දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් දියුණු කිරීම - ජාතික විවෘත ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මගින් තෝරාගනු ලබන සේවාදායකයෙකු (Service Provider) හරහා සිදු කිරීම. ❖ විශේෂඥ උපදේශන සේවාව - මොරටුව විශ්ව විද්‍යාලයෙන් ලබා ගැනීමට යෝජිතය. (ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල සන්දේශයක් සකස් කරමින් පවතී.) විවෘත පදනමින් තෝරා ගැනීමට කටයුතු කර ඇත. ❖ Implementing Agency - සුරාබදු දෙපාර්තමේන්තුව / සියලුම පුද්ගලික මත්පැන් නිෂ්පාදනාගාර ඇතුළු මත්පැන් බලපත්‍රධාරීන්. ❖ Executing Agency - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
7.3.2	සියලුම නිෂ්පාදන සඳහා ව්‍යාජ නොවන එකම ආකාරයේ ආරක්ෂිත බදු මුද්‍රා ක්‍රමයක් හඳුන්වා දීම. • ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව වෙත නිෂ්පාදනයන්හි සත්‍යතාව හඳුනා ගැනීමේ ක්‍රමයක් පැවතීම. • QR යෙදුමක් හරහා සත්‍යතාව තහවුරු කිරීමට පාරිභෝගිකයාට ඇති හැකියාව. • අදාළ බදු මුද්‍රාව ඇලවීම සිදු කරන අවස්ථාවේ ස්වයංක්‍රීයව බදුකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම. • නිෂ්පාදිත දිනය, ස්ථානය සහ අනෙකුත් අදාළ තොරතුරු දැක්වීම.	මේ සම්බන්ධයෙන් 2023.09.15 දින මැද්‍රාස් සෙකියුරිටි ප්‍රින්ටර්ස් හි කළමනාකාර අධ්‍යක්ෂ වෙත ලිපියක් නිකුත් කර ඇත.**(ඇමුණුම 14)** එම ලිපියට පිළිතුරු 2024.03.07 දිනැති ලිපිය **(ඇමුණුම 15)** අනුව ආරක්ෂිත ස්ටිකරයේ ඇති සළකුණු මඟින් සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ව්‍යාජ ස්ටිකර් හඳුනා ගැනීමේ හැකියාවක් පවතින අතර ඊට අමතරව තහවුරු කර ගැනීමක් අවශ්‍ය වේ නම් වෝහාරික පරීක්ෂාවන් සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ හැකි බව දන්වා ඇත. තවද ව්‍යාජ ලෙස ස්ටිකර් සැදීම වැළැක්වීම සඳහා නව මුහුණුවරකින් සමන්විත ස්ටිකර් නිර්මාණය සඳහා ආරක්ෂිත සළකුණු හා ආරක්ෂිත සළකුණු කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලැබී ඇත. හඳුන්වා දෙන නව ස්ටිකරයට අදාළ නව තොග මිළදී ගැනීමට අදාළව ගැනුම් ඇණවුම් වවුචරයට (purchase order) ආරක්ෂිත සළකුණු හා ආරක්ෂිත සළකුණු කළමනාකරණ කමිටුවේ අනුමැතිය බලාපොරොත්තු වේ. ඩිජිටල් කේත මුද්‍රණය පෙර පියවි ඇසට නොපෙනෙන ආකාරයට මුද්‍රණය වූ අතර මේ වන විට පියවි ඇසට පෙනෙන ආකාරයෙන් මුද්‍රණය කිරීමට කටයුතු යොදා ඇත. මෙහි මූලික පියවර වශයෙන් ඩිජිටල් කේත මුද්‍රණය කරන එක් නිෂ්පාදනාගාරයක් වෙත අදාළ උපකරණ සවිකර පියවි ඇසට පෙනෙන පරිදි ඩිජිටල් කේත මුද්‍රණය සිදු කිරීම ආරම්භ කර ඇත. මෙම ගිවිසුම ස්ටිකර් නිකුත් කිරීම සම්බන්ධව නිර්මාණය වූ ගිවිසුමක් බැවින් බදු ගණනය කිරීමට අවශ්‍ය වේ නම් ඒ සඳහා change request හරහා නව පද්ධති ක්‍රමවේදයක් (process work flow) සැකසීමට කටයුතු කළ යුතු බව දැක්විය හැක.

		තවද මේ වන විටත් මහජනයා වෙත නිකුත් කර ඇති ජංගම යෙදුම (Mobile APP) හරහා ස්ථිකරය සක්‍රීය කල දින, නිෂ්පාදන ආයතනය, සැර හා අනෙකුත් තොරතුරු ලබා ගැනීමට හැකියාවක් පවතින බව තවදුරටත් දන්වා ඇත.
7.3.3	මත්පැන් නිෂ්පාදකයන්ට සිල්ලර වෙළඳසැල් වලින් දින හතක කාලසීමාවක් තුළ මත්පැන් බෝතල් අලෙවියෙන් ලබන ආදායම් කාර්යක්ෂමව එකතු කර ගත හැකි ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කරන අතර, ඉන් පසුව, මෙම නිෂ්පාදකයින්ට දින 15 ක කාලයක් තුළ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට සුරාබදු බදු ගෙවීමට හැකි විය යුතුය. බදු එකතු කිරීම විධිමත් කිරීම, ඇති වන ප්‍රමාදයන් අවම කරගැනීම සහ යහපත් මුදල් ප්‍රවාහයක් පවත්වා ගැනීමට මත්පැන් නිෂ්පාදකයින්ට හැකියාව ලැබීම පිළිබඳව අරමුණ.	සුරාබදු ආඥා පනත අනුව හා අනෙකුත් පවතින නීති රාමුව තුළ මත්පැන් කර්මාන්තයේ නිෂ්පාදන කටයුතුවලට අදාළව අධීක්ෂණය හා නියාමනය සඳහා ක්‍රියාකිරීමට හැකියාව පැවතුනත් මත්පැන් නිෂ්පාදනය හා සිල්ලර වෙළෙඳුන් අතර පවතින ගණුදෙනු සඳහා සුරාබදු දෙපාර්තමේන්තුවට මැදිහත් වීමට නෛතික හැකියාවක් නොමැත.
7.3.4	සියලුම මත්පැන් නිෂ්පාදකයින්ගෙන් හිඟ බදු අයකර ගැනීම සඳහා ඵලදායී ගෙවීමේ සැලැස්මක් සකස් කිරීම හා එම ගෙවීමේ සැලැස්ම මඟින් හිඟ බදු නියමිත වේලාවට අය කර ගැනීමට සහතික කිරීම.	දැනටමත් සුරාබදු දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශය හා නීති අංශය එක්ව නිෂ්පාදකයින්ගෙන් හිඟ බදු අයකර ගැනීමේ ගිවිසුම්වලට එළඹී ඇති අතර 2024.11.30 ට පෙර අදාළ හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇත. **(ඇමුණුම 16)**
7.3.5	රජයේ රස පරීක්ෂකවරයා විසින් යම් නිෂ්පාදනයක් මිනිස් පරිභෝජනයට සුදුසු බවට තහවුරු කරන සහතිකයක් නිකුත් කරන තෙක් කිසිදු මත්පැන් නිෂ්පාදන තොගයක් වෙළඳපොළට බෙදා හැරීම නොකළ යුතු බව හා මේ සම්බන්ධව වගකීම අදාළ නියාමන ආයතනය ලෙස ශ්‍රී	දේශීය වෙළඳ පොළෙහි අලෙවිය සඳහා නිකුත් කරනු ලබන ස්ප්‍රිතුවලින් නිපදවන මත්පැන් වර්ගවල ප්‍රමිතිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව කාර්මික තාක්ෂණ ආයතනය (ITI), ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා මධ්‍යසාර කර්මාන්තයෙහි නියෝජිතයන් යන පාර්ශවයන්ගේ සහභාගීත්වය ඇතිව සිදුකරන ලද පරීක්ෂණවල ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් 2022.05.25 දින අංක ඊඩී/05/01 General – IX දරන ලිපිය මඟින් මත්පැන් නිෂ්පාදනාගාර වෙත මෙම ප්‍රමිතීන් පිළිබඳව දැනුම්දී ඇති අතර මේ වන විට එම ප්‍රමිතීන්ට අදාළව මත්පැන් නිෂ්පාදනය සිදුවේ. ඊට අමතරව, මෙම ප්‍රමිතීන් අනුව

<table>
<tr><td></td><td>ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව වෙත පැවරූ රාජකාරිය ඉටු කිරීම.</td><td>මත්පැන් නිෂ්පාදනය සිදුවන බවට සහතික වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව වගකිවයුතු බැවින් මෙම ප්‍රමිතීන් ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය කෙටුම්පත සකස් කරමින් පවතී.</td></tr>
<tr><td>7.3.6</td><td>ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයෙන් බඳවාගත් ස්වාධීන කාර්ය මණ්ඩලයක් ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ අලුතින් ඉදිකරන ලද රසායනාගාරය වෙත යෙදවීම සහ රසායනාගාරය සඳහා අවශ්‍ය ප්‍රතිතනය ලබා ගැනීම.</td><td>සුරාබදු දෙපාර්තමේන්තුව වෙනුවෙන් ස්ථාපිත කරනු ලබන නව රසායනාගාරය වෙනුවෙන් පහත තනතුරු සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1175/Vol. IV හා 2024.04.18 දිනැති ලිපිය මඟින් අනුමැතිය ලැබී ඇත.
<table>
<tr><th></th><th>තනතුර</th><th>අදාළ වන සේවය</th><th>ශ්‍රේණිය/ පන්තිය</th><th>වැටුප් කේතය (රා.ප.ව. 3/2016 අනුව)</th><th>අනුමත තනතුරු සංඛ්‍යාව</th></tr>
<tr><td>1</td><td>අධ්‍යක්ෂ</td><td>ශ්‍රී.ලං.විද්‍යා. සේවය</td><td>I</td><td>SL 1</td><td>01</td></tr>
<tr><td>2</td><td>නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ</td><td>ශ්‍රී.ලං.විද්‍යා. සේවය</td><td>III/II</td><td>SL 1</td><td>01</td></tr>
<tr><td>3</td><td>රසායනාගාර විශ්ලේෂක</td><td>දෙපාර්ත මේන්තුගත</td><td>III/II/I</td><td>MN 3</td><td>04</td></tr>
<tr><td>4</td><td>රසායනාගාර සහයක</td><td>දෙපාර්ත මේන්තුගත</td><td>III/II/I විශේෂ</td><td>PL 2</td><td>02</td></tr>
<tr><td>5</td><td>රසායනාගාර උපස්ථායක</td><td>දෙපාර්ත මේන්තුගත</td><td>III/II/I විශේෂ</td><td>PL 1</td><td>02</td></tr>
</table>
2. ඒ අනුව, ඉහත අංක 01 හා 02 තනතුරු වෙනුවන් අවශ්‍ය පුරප්පාඩු පිරවීමට අදාළව ඉදිරි කටයුතු සඳහා විද්‍යාත්මක සේවා මණ්ඩලය වෙත 2024.05.31 දිනැතිව ලිපි යවා ඇත.

3. අංක 03, 04 හා 05 තනතුරු වලට අදාළව නව බඳවා ගැනීමේ පටිපාටි සකස්කළ යුතුව ඇති බැවින් ඒ සම්බන්ධ කටයුතු මේ වනවිට සිදුකරමින් පවතී.</td></tr>
<tr><td>7.3.7</td><td>ස්වභාවික රා කෘතිම රා වලින් වෙන් කර හඳුනා ගැනීම සඳහා සරල ක්‍රමවේදයක් සැකසීම සම්බන්ධව.</td><td>මහ රා සම්බන්ධව ප්‍රමිතීන් සකස් කිරීමට අදාලව කාර්මික තාක්ෂණික ආයතනය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමග ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව එක්ව කරන ලද සාකච්ඡාවක් අනුව මුළු දිවයිනම ආවරණය වන පරිදි ප්‍රදේශ හතරකින් රා සාම්පල් ලබාගෙන අදාළ ප්‍රමිතීන් සකස් කිරීමට තීරණය විය. එම කටයුතු 2024.03.28 දින අවසන් කර මහ රා සඳහා ප්‍රමිතීන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් නිකුත් කරන ලදී. එම ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කිරීමට පෙර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ශ්‍රී ලංකා සුරාබදු</td></tr>
</table>

		දෙපාර්තමේන්තුව, කාර්මික තාක්ෂණික ආයතනය සහ මහ රා නිෂ්පාදකයින් වෙත ඉදිරිපත් කර ඔවුන්ගේ අදහස් දැක්වීම සඳහා 2024.04.26 දින රැස්වීමක් පවත්වන ලදී. එම රැස්වීමේදී මතු වූ කරුණු සහ එකඟතා අනුව දේශගුණය වෙනස් වන තවත් ප්‍රදේශ කිහිපයකින් රා සාම්පල් ලබාගෙන පරීක්ෂා කිරීමට තීරණය කරන ලදී. නැවත ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් රා පිලිබඳ පරීක්ෂාවන් සිදු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ද මේ වන විට සිදු කර ඇති අතර අදාළ ප්‍රදේශ වලින් රා සාම්පල් ලබාගැනීම ආරම්භ කිරීමට නියමිතය.
7.3.8	වෙළඳපොළේ ඇති රා ප්‍රමාණය සහ ස්වභාවිකව නිපදවන රා ප්‍රමාණය අතර වෙනස සොයා බලා කෘතිම රා නිෂ්පාදනය කිරීමේ ක්‍රමය සොයා ගැනීමට යාන්ත්‍රණයක් සැකසීමට අවශ්‍ය කටයුතු සැලසුම් කිරීම.	මෙම නිර්දේශය සමඟ එකඟ වේ. ඉහත 7.3.7 ක්‍රියාත්මක වූ පසුව මේ සඳහා ක්‍රමවේදයක් සකස් කරනු ඇත.
7.3.9	රා නිෂ්පාදනාගාර 38 ක් දිනපතා නිරීක්ෂණය කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම හා ඒවායින් දෛනිකව නිපදවන මත්පැන් පරිමාව ගණනය කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.	දැනටමත් බෝතල් රා නිෂ්පාදනාගාර දෛනිකව අධීක්ෂණය කරන අතර මාර්ගගත ක්‍රමයට ස්ටිකර් යාවත්කාලීන කිරීම හා බදු ගණනය කිරීම සිදු කෙරේ.
7.3.10	නිෂ්පාදනය, ගබඩා කිරීම සහ ප්‍රවාහනය කිරීම යන අදියර තුන යටතේ එතනෝල් අපතේ යන ප්‍රමාණය තීරණය කිරීම සඳහා නිසි විද්‍යාත්මක පරීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු කිරීම.	සුරාබදු දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ස්කාගාර, ගුදම් හා නිෂ්පාදනාගාර තුළ පවතින අපතය සම්බන්ධව ගැටළු හඳුනාගෙන විධිමත් ක්‍රමවේදයන් තුළ අපතය තීරණය කිරීමට දෙපාර්තමේන්තුවේ නීති අංශය මඟින් කටයුතු කරමින් පවතී. මත්පැන් නිෂ්පාදනයේදී සු.නි. 991 අනුව සිදු වන අපතය සම්බන්ධව කටයුතු කිරීම සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් කමිටුවක් පත්කොට ඇත.

7.3.11	සෑම මත්පැන් නිෂ්පාදනාගාරයකටම සීසීටීවී දර්ශන ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ඒකකය වෙත යැවීමෙන් එක් එක් මත්පැන් නිෂ්පාදනාගාරයේ සීසීටීවී දර්ශන නිරීක්ෂණය කිරීමේ පහසුකම සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත ලබා දීම.	සුරාබදු දෙපාර්තමේන්තුවේ දැනට මත්පැන් නිෂ්පාදනාගාර 26ක් පවතින අතර එම ආයතන තුළ දැනටමත් ඔවුන් විසින් ස්ථාපනය කරන ලද CCTV පද්ධතීන් ඇති නමුත් එම එක් එක් ආයතන විවිධ CCTV සේවා සපයන ආයතන මඟින්, විවිධ තාක්ෂණික ක්‍රමවේද භාවිතා කර මෙම කටයුත්ත සිදු කරගෙන ඇති නිසා එම සෑම නිෂ්පාදනායතනයකම CCTV කැමරා පද්ධතීන් එකිනෙකට සම්බන්ධ කිරීමේ අනුකූලතා ගැටළු (compatibility issues) පැන නැඟී ඇත. එම නිසා එම සෑම නිෂ්පාදන ආයතනයකටම නැවත එකම CCTV සේවා සපයන ආයතනයක් හරහා නව CCTV පද්ධතීන් ස්ථාපිත කිරීමට යෝජනා කර ඇත. තවද, දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය හා තවත් CCTV සේවා සපයන ආයතන සමඟ මේ පිළිබඳ සාකච්ඡා කළ අතර එහිදී අනාවරණය වූයේ CCTV කැමරා පද්ධතීන් භාවිතා කර හුදෙක් දුරස්ථව අධීක්ෂණය කිරීම පමණක් නොව නවීන තාක්ෂණය හා AI තාක්ෂණය භාවිතා කර එම නිෂ්පාදනාගාර තුළ දෛනිකව සිදු වන මත්පැන් නිෂ්පාදන බෝතල් ගණන, බෝතල් වර්ගය, බෝතල් මත ස්ටිකර් ඇලවී ඇතිද බව, ඒ ස්ටිකර් ව්‍යාජ ඒවාද බව, දිනක සම්පූර්ණ බදු ගණනය කිරීම ආදී විශාල දත්ත ප්‍රමාණයක් විශ්ලේෂණය කර ලබා ගත හැකි බවයි. තවද මෙවැනි දියුණු CCTV කැමරා පද්ධතියක් හරහා යම් කිසි දෝෂයක් අනාවරණය වුවහොත් ඒ බව ඒ අවස්ථාවේම අදාළ අංශ වෙත දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් (Alert System) ද අන්තර්ගත වේ. එම නිසා දෙපාර්තමේන්තුව හුදෙක්ම මත්පැන් නිෂ්පාදනාගාර තුළ CCTV කැමරා පද්ධති ස්ථාපනය කර එය දුරස්ථව අධීක්ෂණය කිරීමට වඩා ඉහත පරිදි නව තාක්ෂණය භාවිත කර වැඩි ඵලදායී CCTV කැමරා පද්ධතියක් ස්ථාපනය කිරීමට යෝජනා වී ඇති අතර, දැනට මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවට පෙර අත්දැකීම් නොමැති නිසා එම කටයුත්ත ඉටු කිරීමට පෙර තවදුරටත් අධ්‍යයනය කර ස්ථාපනය කිරීම වඩා යෝග්‍ය වන අතර ඒ සඳහා යම් කිසි කාලයක් අවශ්‍ය වේ. එලෙසම, දෙපාර්තමේන්තුව ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන RASED පද්ධතියේ ද මෙවැනිම දුරස්ථව අධීක්ෂණය කිරීමේ අවශ්‍යතාවක් නිෂ්පාදන මොඩියුලයේ (Production Module) ඉදිරිපත් කර ඇති නිසා මෙම නව තාක්ෂණය භාවිතයෙන් ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වන CCTV කැමරා පද්ධතිය හා RASED පද්ධතියේ මොඩියුල අතර අනුකූලතා ද මෙහිදී සැලකිල්ලට ගැනීමට සිදු වේ. එම නිසා CCTV කැමරා පද්ධති ස්ථාපනය කිරීමට පෙර ඒ පිළිබඳ මනා අධ්‍යනයක් කර ක්‍රියාවට නැංවීම සඳහා දෙපාර්තමේන්තුවට තව දුරටත් කාලය අවශ්‍ය බව දන්වා ඇත.

7.3.12	බදු ගෙවීමට හැකි වන පරිදි මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කරන මත්පැන් අලෙවිය නියාමනය කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීමට නිර්දේශ කර ඇති අතර ඒ අනුව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කරන මත්පැන් අලෙවිය නිරීක්ෂණය කිරීමට හැකි අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සංශෝධනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම.	සංශෝධිත සුරාබදු පනතට ඇතුළත් කර මේ වන විට නීති කෙටුම්පත් අංශයට යොමු කර ඇත.
7.3.13	මත්පැන් බලපත්‍රයක් අලුත් කිරීමේදී හෝ නව මත්පැන් බලපත්‍රයක් නිකුත් කිරීමේදී තැන්පතුවක් තැබීම අවශ්‍ය වන පරිදි 1912 අංක 08 දරන සුරාබදු ආඥා පනතට අවශ්‍ය නීතිමය සංශෝධන හා තැන්පතු ක්‍රමයක් ස්ථාපිත කිරීමේදී බැංකු ඇපකරයක් හෝ සුදුසු බැඳුම්කරයක් වැනි විකල්ප සලකා බැලීමත්, යෝජිත තැන්පතු මුදල, වාර්ෂිකව අලුත් කිරීම සඳහා ප්‍රතිපාදන සහිතව එක් එක් මත්පැන් නිෂ්පාදකයා සඳහා මාස හයක නිෂ්පාදන ධාරිතාවට සමාන මුදලක් වීම සම්බන්ධව.	සුරාබදු නිවේදන 1004 සංශෝධනය කර 03/2024 සුරාබදු නිවේදන මඟින්, i. වාර්ෂික බලපත්‍ර ගාස්තුව ii. ආරක්ෂිත ඇප මුදල් හා iii. කර්මාන්ත ප්‍රවේශය සඳහා එක් වරක් පමණක් අය කරනු ලබන ගාස්තුව ලෙස ගාස්තු සංශෝධනය කර ඇත.
7.3.14	මැඩ්රාස් සෙකියුරිටීස් පුද්ගලික සමාගම විසින් භාවිතා කරන ලද කඩදාසියේම එම ව්‍යාජ ආරක්ෂිත බදු මුද්‍රණය කර ඇති බව රජයේ රස පරීක්ෂක වාර්තාවෙන් ඔප්පු වුවහොත් මැඩ්රාස් සෙකියුරිටීස් පුද්ගලික සමාගම සමඟ ඇති කරගත් ගිවිසුම අවසන් කිරීමට ගත් ක්‍රියාමාර්ග.	2023.12.19 දින රජයේ රස පරීක්ෂක වෙත යොමු කර ඇත. නිෂ්පාදිත අමුද්‍රව්‍ය සම්බන්ධයෙන් විමසීමක් කර ඇති අතර ඒ සම්බන්ධයෙන් ආණ්ඩුවේ රස පරීක්ෂක විසින් විශ්ලේෂණ වාර්තාවේ සඳහන් කර නොමැත. ආරක්ෂිත සළකුණු සම්බන්ධයෙන් පමණක් පැහැදිලි කිරීමක් කර ඇත. **(ඇමුණුම 17)**

7.3.15	මත්පැන් නිෂ්පාදකයින් විසින් සිදු කරනු ලබන වැරදි සඳහා අදාළ වන සංයුක්ත ගාස්තුව වැඩි කිරීම සඳහා 1912 අංක 08 දරන සුරාබදු ආඥා පනතේ 56 වැනි වගන්තිය සංශෝධනය කිරීමට නිර්දේශ කළ අතර 1990 අංක 37 දරන සුරාබදු (සංශෝධන) පනත මඟින් රු. ලක්ෂ පහක් (රු. 500,000.00) ලෙස නියම කර ඇති දැනට පවතින මුදල ගැළපීමෙන් ප්‍රතිලාභ ලැබිය හැකිද යන්න.	දැනටමත් සුරාබදු ආඥා පනත සංශෝධනය කර එහි කෙටුම්පත සකස් කිරීමේ මූලික කටයුතු කර ඇත.
7.3.16	ව්‍යාජ ආරක්ෂිත බදු මුද්‍රා ඇලවීම නිසා සුරාබදු දෙපාර්තමේන්තුව හරහා රටට අහිමි වූ ආදායම පිළිබඳ විශේෂ විශ්ලේෂණයක් මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මඟින් සිදු කිරීම සම්බන්ධව.	මේ සම්බන්ධයෙන් විශේෂ විශ්ලේෂණයක් සිදු කිරීම සඳහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයෙකුගේ ප්‍රධානත්වයෙන් දැනටමත් ආරක්ෂිත සලකුණු සහ ආරක්ෂිත සලකුණු කළමනාකරණ කමිටුව පත් කර ඇත. එම කමිටුව මඟින් මේ සම්බන්ධයෙන් සොයා බලනු ලැබේ.

7.3.1 සඳහා ඇමුණුම

ඇමුණුම 13

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා ආදායම් පරිපාලන පද්ධතියක් ස්ථාපිත කිරීම

රැස්වීම් වාර්තාව

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ ප්‍රධානත්වයෙන් 2024.04.29 දින ප.ව.2.30 ට අමාත්‍යාංශයේ 206 කාමරයේදී පැවැති ඉහත කමිටු රැස්වීම් වාර්තාව පහත පහත පරිදි ඉදිරිපත් කරමි.

සහභාගීත්වය

ඩී.එච්.එස්.පුල්ලපෙරුම මිය - සභාපති
අතිරේක ලේකම්
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

එම්.ජේ. ගුණසිංහ මයා - සාමාජික
කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

ඉඛ්. ආර්. පත්මප්‍රිය මයා - සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

එම්.ආර්.ජී.ඒ.වී. මුතුකුඩේ මයා - සාමාජික
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (වැ.ඛ.)
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

එම්.එම්.සී.පී. මොහොට්ටිගෙදර මයා - සාමාජික
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (රා.ඉ.)
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

[illegible] - සාමාජික
[illegible] සහකාර ලේකම්
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

[illegible] - සාමාජික
[illegible] අධ්‍යක්ෂ
[illegible] තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

සාකච්ඡා කළ කරුණු හා ලබාදුන් තීරණ

අනු අංකය	සාකච්ඡා කළ කරුණු	ලබාදුන් තීරණ	වගකීම
01.	සුරාබදු දෙපාර්තමේන්තුව වෙත හඳුන්වාදීමට නියමිත ආදායම් පරිපාලන පද්ධතිය සඳහා උපදේශන සේවාවන් ලබා ගැනීම මොරටුව විශ්ව විද්‍යාලය විසින් ලබා දී ඇති ඇස්තමේන්තුව	ඉදිරිපත් කර ඇති මිල ගණන් ඉතා ඉහල බැවින් ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ප්‍රසම්පාදනය ක්‍රමයට යොමුවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීම	ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
02.	ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ප්‍රසම්පාදනය ක්‍රමයට අදාල ලංසු කැඳවීමේ ලේඛණ සැකසීම	මේ සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම සහිත උපදේශකවරයකු දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මඟින් තෝරා ගැනීම	සුරාබදු කොමසාරිස් ජනරාල්

ජ්.එම.ඒ.පී. මොහොට්ටිගෙදර
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (රා.ඉ.)
03.04.30

7.3.2. සඳහා යොමුව
යොමුව 14

226 P

Annexture

රජයේ ප්‍රකාශන
நாயகம்
General
2380166
2877890

සුරාබදු කොමිසාරිස් ජනරාල්
(පරිපාලන හා සැලසුම්)
நிர்வாகமாளர் நாயகம்
(கொள்கை, நிர்வாகம்))
Additional Commissioner General (Revenue Policy & Admin)
2877891

අතිරේක සුරාබදු කොමිසාරිස් ජනරාල්
(ආදායම් කළමනාකරණ හා නීති බලාත්මක කිරීම)
மேலதிக ஆணையாளர் நாயகம்
(வருமான முகாமைத்துவம், சட்டவலுப்படுத்தல்)
Additional Commissioner General (Revenue Management&Law Enforcement)
2877892

ෆැක්ස් යන්ත්‍රය
பெக்ஸ்
Fax
2877890

ඊ-මේල්
மின்னஞ்சல்
E-Mail
excisem@slt.lk

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
இலங்கை மதுவரித் திணைக்களம்
EXCISE DEPARTMENT OF SRI LANKA

දුරකථන අංකය
தொலைபேசி
எண்.
Telephone No
2045000/
2380904/
2303258

අංක 353, කොට්ටේ පාර, රාජගිරිය. இல. 353, கோட்டே வீதி, ராஜகிரிய. No 353, Kotte Road, Rajagiriya.

මගේ අංකය
எமது இல.
My No.
ED/13/4-Vol.4

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
15.09.2023

Managing Director,
M/S Madras Security Printers Private Limited (MSPPL),
B-6 Phase 1, Mepzsez Thambaram,
Chennai 660 0415, India.

Dear Sir,

INTRODUCE A HOMOGENOUS FOOLPROOF STICKER SYSTEM FOR ALL 23 LIQUOR MANUFACTORIES

Ways and means committee of the parliament has directed this Department to introduce a homogenous foolproof sticker system for all 23 liquor manufactories by the end of the year 2023 including the following components:

- Authenticity identification for the consumer and the EDSL,
- Consumer friendliness,
- Inability to evade taxes
- Indication of date, place of manufacturing and all other relevant information

3. The Ways and means committee has also directed this Department to complete the introduction of the above homogencus foolproof sticker system on or before 31st December 2023.

2. Therefore, I hereby urge you to submit your observations and suggestions on the technical feasibility and method of implementation of the above directive within the stipulated timeframe.

J.M.S.N. Jayasinghe
Commissioner General of Excise

Original received
19/09/2023

Copies:

I. Chairman, Committee on Ways and Means of the Parliament
II. Secretary, Ministry of Finance .
III. Chairman, Fool Proof Sticker Management Committee, Ministry of Finance
IV. Director General, Department of Fiscal Policy
V. Director General (Government Revenue), Presidential Secretariat

7.3.2. සඳහා පැමිණීම

Annexture 15

MADRAS SECURITY PRINTERS PRIVATE LIMITED

Regd. Office: 72 (Old No.781), THIRUVOTTIYUR HIGH ROAD, CHENNAI- 600 081, INDIA
PHONES: 00 91 44 25912699, 25916086, 25916942, FAX: 00 91 44 259113385
E-mail: customerrelations@madrassecurityprinters.com Website: www.madrassecurityprinters.com

Commissioner General of excise,
Excise Department of Sri Lanka,
No 353, Kotte Road,
Rajagiriya, Sri lanka.

07 MAR 2024

MSP/EDSL/070324

07/03/2024

Respected Sir,

Re: INTRODUCE A HOMOGENOUS FOOLPROOF STICKER SYSTEM FOR ALL 23 LIQUOR MANUFACTORIES

Greetings From MSP Pvt Ltd!

We acknowledge receipt of your letter dated 15.09.2023 with reference to ED/13/04 Vol-04 on the above subject.

We inform you that EDSL should decide to introduce a homogenous foolproof sticker system for all manufacturers. We are able to do digital marking or physical stamping according to your instructions.

Further, following will be our observations and suggestions for the points you have highlighted.

1. **Authenticity Identification for the EDSL.**

Look for Security Features: Genuine excise tax stamps often contain various security features that are difficult to replicate. These features may include holograms, watermarks, microprinting, special inks, and other elements designed to deter counterfeiting.

Check for Serial Number and Unique Code: Authentic excise tax stamps may have serial number and unique codes printed on them. You can verify these codes with the issuing authority to ensure they are legitimate.

Inspect Quality and Details: Genuine tax stamps are usually produced with high-quality printing techniques. Inspect the stamp closely for any signs of poor print quality, such as blurred text or images, uneven borders, or smudges.

MasterCard

MSP

MADRAS SECURITY PRINTERS PRIVATE LIMITED

Regd. Office: 72 (Old No.781), THIRUVOTTIYUR HIGH ROAD, CHENNAI- 600 081, INDIA
PHONES: 00 91 44 25912699, 25916086, 25916942, FAX: 00 91 44 259113385
E-mail: customerrelations@madrassecurityprinters.com Website: www.madrassecurityprinters.com

Consult Experts: If filed officers uncertain about the authenticity of a tax stamp, consider seeking advice from trained excise officer who authorised to examine the forensic features by using the established forensic lab at the department of Excise.

2. **Ability to consumer to verify the authenticity through a QR App**

QR Code on Tax Stamps: Each excise tax stamp issued by the Sri Lanka excise department would contain a unique QR code. This QR code would be generated during the stamp production process and would contain encrypted information about the stamp's authenticity

QR Code Scanner App: Consumers would download a QR code scanner app onto their smartphones. This app would be available for free on app stores (android/iOS) and would allow users to scan QR codes with their device's camera.

Verification Process: When consumers purchase a product with an excise tax stamp, they can use the QR code scanner app to scan the QR code on the stamp. The app would then decrypt the information embedded in the QR code and verify its authenticity.

Instant Feedback: After scanning the QR code, the app would provide instant feedback to the consumer regarding the authenticity of the tax stamp. This feedback could be in the form of a simple message such as "Valid" or "Invalid," along with additional details if necessary.

Anti-counterfeiting Measures: To prevent counterfeiters from replicating QR codes, the encryption algorithm used to generate the QR codes would be robust and difficult to reverse-engineer. We have a plan to introduce the move to the general public with the launch of the new sticker design planned for 2024 since it required specific security features to be added.

MasterCard

MSP

MADRAS SECURITY PRINTERS PRIVATE LIMITED

Regd. Office: 72 (Old No.781), THIRUVOTTIYUR HIGH ROAD, CHENNAI- 600 081, INDIA
PHONES: 00 91 44 25912699, 25916086, 25916942, FAX: 00 91 44 259113385
E-mail: customerrelations@madrassecurityprinters.com Website: www.madrassecurityprinters.com

In addition, MSP's research and development team works to change ink color from UV to visible while meeting essential security requirements such as overt, covert, and forensics.

As a result, we will be able to go ahead simultaneously with the new visible digital marking system in 2024 when EDSL is due to introduce a new paper tax stamp.

3. Automatic taxation at the moment of placing it

Integration with Excise Tax Stamp System: Integrate the tax calculation algorithm with the excise tax stamp production system. When a manufacturer or importer requests excise tax stamps for their registered products, the system automatically calculates the tax amount for each product and generates corresponding excise tax stamps.

Real-Time Verification: Implement a real-time verification mechanism to ensure that only registered products with valid excise tax stamps are allowed to be sold in the market. This verification can be done at various checkpoints, such as customs clearance points, distribution canters, or retail outlets.

Centralized Database: Maintain a centralized database that stores information about registered products, excise tax calculations, issued tax stamps, and verification status. This database would be accessible to relevant stakeholders, including tax authorities, manufacturers, importers, and law enforcement agencies.

According to the agreement signed by the Finance Ministry, Excise Department, and MSP Pvt Ltd, there is no need for such a facility in the current system. Hence EDSL is required to submit a "Change Request" with detailed process flow of the taxation process to add that facility to the existing software (Foolproof Management system) at an additional cost.

4. Indicating the date, Place of manufacturing and all other relevant information.

This information is already available by scanning the particular excise stamp through the "Excise Tax stamp validator" application and there is an additional provision to retrieve the same data manually by using the unique identity code assigned.

Further, there is capability to add more details about what the EDSL wants to show to general public.

MasterCard

MSP

MADRAS SECURITY PRINTERS
PRIVATE LIMITED

Regd. Office: 72 (Old No.781), THIRUVOTTIYUR HIGH ROAD, CHENNAI- 600 081, INDIA
PHONES: 00 91 44 25912699, 25916086, 25916942, FAX: 00 91 44 259113385
E-mail: customerrelations@madrassecurityprinters.com Website: www.madrassecurityprinters.com

Therefore, please let us know to the best of your ability the requirements and changes to be followed in a comprehensive report as this change request may take considerable time to implement, prioritizing new implementations to be followed by the Excise Department.

Yours Sincerely,

Imalka Jayasinghe

Operation Manager – Sri Lanka

TÜV NORD CERT GmbH

MasterCard

7.3.4 වගුව ගැලපෙන
ගැලපෙන 16

Tax Arrears Summary up to 31st May 2024

Serial No	Name of the Company/Person	Period of default Tax	Tax Arrears		Total Late Charges up to31.05.2024	Total tax with late charges up to 31.05.2024
			up to 31.12.2022	2023- 2024		
1	W.M.Mendis Company (Welisar Moragalla)	(According to the Agreement)	1,292,877,137.79	-	2,115,446,380.67	3,408,323,518.46
2	W.M.Mendis Company (Welisara)	2023		1,478,464,480.06	100,307,514.87	1,578,771,994.93
	Total		**1,292,877,137.79**	**1,478,464,480.06**	**2,215,753,895.54**	**4,987,095,513.39**
3	Wayamba Distilleris	2004-2005	92,601,780.76			92,601,780.76
4	Wayamba Spirit	2004	41,931,975.76		238,670,903.48	280,602,879.24
5	Glob Blenders	1997-2004	127,018,962.59		1,017,310,882.44	1,144,329,845.03
6	Maclum Brewery		147,701,420.80		467,832,339.00	615,533,759.80
7	Kalutara Co-operative Distilleris	2019	6,104,615.00		11,590,999.05	17,695,614.05
8	Sinergy Distileries	2023		44,315,803.24	5,209,009.58	49,524,812.82
9	Higurana Distileries	2023-2024		111,176,817.96	1,338,948.70	112,515,766.66
10	Vayamba Distilleris / Royal Ceylon Distileries	2023-2024		94,653,445.08	7,473,382.57	102,126,827.65
11	Finland Distileirs	2024		41,598,043.34	1,337,400.53	42,935,443.87
	Total		**1,708,235,892.70**	**1,770,208,589.68**	**3,966,517,760.89**	**7,444,962,243.27**

7.3.14 සඳහා ඇමුණුම
ඇමුණුම 17
(186)

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
அரசாங்க இரசாயனப் பகுப்பாய்வாளர் திணைக்களம்
GOVERNMENT ANALYST'S DEPARTMENT

අංක 31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල.
இல. 31, இசுறு மாவத்தை, பெலவத்த, பத்தரமுல்ல.
No. 31, Isuru Mawatha, Pelawatta, Battaramulla.
SRI LANKA.

දුරකථන தொலைபேசிகள் Telephones } 011 - 2786395, 011 - 2176800
ෆැක්ස් தொலைநகல் Fax } 2786394
E-mail : govanalyst@sltnet.lk

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව SRI LANKA CUSTOMS
04 JAN 2024
සුරාබදු කොමසාරිස් ජනරාල් කාර්යාලය

SLAB ACCREDITED ISO/IEC 17025 TL 089-01

මගේ අංකය எனது இல. My No. } එච්.පී.277/23
ඔබේ අංකය உமது இல. Your No. }
දිනය திகதி Date } 2023.12. 18

අත්අඩංගුවට ගත් සැකකටයුතු මත්පැන් බෝතල්වල අලවා ඇති ස්ටිකරයේ නිරවද්‍යතාවය සම්බන්ධ විශ්ලේෂණ වාර්තාවක් ලබාගැනීම

ඉහත විශ්ලේෂණයට අදාලව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් අංක ED/13/04/vol-04 සහ 2023-09-27 දිනැති ලිපිය සමඟ එවන ලද පැ01 සිට පැ16 ලෙස අංකිත මිලි 180 බෝතලවල අලවා ඇති ආරක්ෂිත ස්ටිකර සම්බන්ධයෙන් සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ නියෝජ්‍ය පරීක්ෂක කේ.ඒ.එස්. කලුආරච්චි මහතා සහ සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක ජේ.එම්.ආර්. ජයසුන්දර මහතා විසින් සම්පාදිත පරීක්ෂණ වාර්තාවයි.

02. ඉහත සඳහන් ස්ටිකර පරීක්ෂා කර බලා 2023-09-27 දිනැති ලිපියෙන් දක්වා ඇති පරිදි වාර්තා කරන ලෙස සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් ඉල්ලා ඇත.

03. පැ01 සිට පැ16 ලෙස අංකිත මිලි 180 බෝතලවල අලවා ඇති ආරක්ෂිත ස්ටිකර සහ මා භාරයේ වූ අනුරූප ආදර්ශ ආරක්ෂිත ස්ටිකර අණ්වීක්ෂය සහ වෙනත් ප්‍රකාශ විද්‍යුත්මක උපකරණ මඟින් විවිධ ආලෝක තත්ත්ව යටතේ පරීක්ෂා කර ඒවා අතර සැසඳීමේදී මා හට පෙනී ගියේ,

3.1 පැ01 සිට පැ10 ලෙස අංකිත මිලි 180 බෝතලවල අලවා ඇති ආරක්ෂිත ස්ටිකර පාරජම්බුල ආලෝකය යටතේ පෙන්වන ප්‍රතිදීප්තියෙන් සහ ආරක්ෂිත උපක්‍රම වලින් අනුරූප ආදර්ශ ස්ටිකර පාරජම්බුල ආලෝකය යටතේ පෙන්වන ප්‍රතිදීප්තියෙන් සහ ආරක්ෂිත උපක්‍රම වලින් වෙනස්කම් දක්වන බවත්,

3.2 පැ11 සිට පැ16 ලෙස අංකිත මිලි 180 බෝතලවල අලවා ඇති ආරක්ෂිත ස්ටිකර පාරජම්බුල ආලෝකය යටතේ පෙන්වන ප්‍රතිදීප්තියෙන් සහ ආරක්ෂිත උපක්‍රම වලින් අනුරූප ආදර්ශ ස්ටිකර පාරජම්බුල ආලෝකය යටතේ පෙන්වන ප්‍රතිදීප්තියෙන් සහ ආරක්ෂිත උපක්‍රම වලින් සමානකම් දක්වන බවත්ය.

04. පැ01 සිට පැ16 ලෙස අංකිත මිලි 180 බෝතල් (ආරක්ෂිත ස්ටිකර සමඟ) බහා එවමි.

(ජේ.එම්.ආර්. ජයසුන්දර)
සැක කටයුතු ලේඛන පිළිබඳ
ආණ්ඩුවේ පරීක්ෂක

(කේ.ඒ.එස්. කලුආරච්චි)
සැක කටයුතු ලේඛන පිළිබඳ
ආණ්ඩුවේ නියෝජ්‍ය පරීක්ෂක

සුරාබදු කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, රාජගිරිය.

Annexture

ENGLISH TRANSLATION

GOVERNMENT ANALYST'S DEPARTMENT

No.31, Isuru Mawatha,Pelawatta,Batatramullla

My Number-H.P.277/23

Date-19.12.2023

Obtaining an analysis report regarding the accuracy of the sticker affixed on the seized suspected liquor bottles

This the investigation report prepared by the Government Deputy Inspector of suspicious Documents, Mr.K.A.S.Kaluarachchi and Government Inspector of Suspicious Documents, Mr.J.M.R.Jayasundara regarding the security sticker affixed in the 180ml bottles numbered from P01 to P16 sent along the letter No. ED/13/04/Vol-04 and dated 27-09-2023 by the Excise Commissioner General of the Excise Department in respect of the above analysis.

02. Excise Commissioner General has requested to check the above mentioned stickers and report as mentioned in the letter dated 27-07-2023.

03. I found by comparing the security stickers affixed to the 180 ml bottles numbered P01 to P16 with the corresponding model security stickers in my possession were examined under different light conditions by microscope and other optical instruments that,

3.1 the security stickers affixed to the 180 ml bottles numbered from P01 to P10 indicate differences in fluorescence under UV light and safety measures from the corresponding model stickers in fluorescence under UV light and security strategies.

3.2. the security stickers affixed to the 180 ml bottles numbered from P11 to P16 indicate similarities in fluorescence under UV light and security strategies. from the corresponding model stickers in fluorescence under UV light and safety measures.

04. The 180ml bottles numbered from P01 to P16 (with the security stickers) will be containerized and sent.

Sgd illegibly

J.M.R.Jayasundara

Government Inspector of Suspicious Documents

Sgd illegibly

K.A.S.Kaluarachchi

Government Deputy Inspector of Suspicious Documents

සමාජ සුභසාධන වැඩසටහන්		
අංකය	නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ගය
9.3.1	අස්වැසුම ප්‍රතිලාභීන්ට ආහාර, ඖෂධ,පාසල් උපකරණ වැනි මූලික අවශ්‍යතා වෙනුවෙන් වියදම් කිරීම සඳහා කෝටාවක් ඇතුළත් කාඩ්පතක් ලබා දීම සහ පොහොර සහනාධාරය මෙම කෝටාවට ඇතුළත් කිරීම නිර්දේශ කෙරේ.	අස්වැසුම සුභසාධක ප්‍රතිලාභී අවසන් ලැයිස්තුව සම්පූර්ණ වීමෙන් පසුව ඉදිරියේදී මේ සම්බන්ධයෙන් ක්‍රමවේදයක් සකස් කිරීම පිළිබඳව සලකා බලනු ලැබේ.
9.3.2	අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය, වැඩිහිටි දීමනා යෝජනා ක්‍රමය, අබාධිතයින් සඳහා වන දීමනාව සහ හඳුනා නොගත් වකුගඩු රෝගීන් සඳහා වන දීමනාව වැනි රජයේ සියලුම සුබසාධක වැඩසටහන් එකිනෙකට සම්බන්ධ කර ඒකාබද්ධ සුබසාධන කළමනාකරණ පද්ධතියක් (IWMS) නිර්මාණය කිරීම නිර්දේශ කෙරේ. තොරතුරු සහතික කිරීමේ මූලික ක්‍රමය ක්ෂේත්‍ර නිලධාරීන්ගේ නිරීක්ෂණ සහ වාර්තා මත පදනම් වන බැවින් ඒකාබද්ධ සුබසාධන කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීම අත්‍යවශ්‍ය වේ.	අස්වැසුම සුබසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමය,වැඩිහිටි, ආබාධිත හා වකුගඩු දීමනා ගෙවීමේ වැඩසටහන ඒකාබද්ධකර ක්‍රියාත්මක කිරීම සඳහා පරිගනක පද්ධතිය දැනටමත් සකස් කර ඇති අතර 2024 ජූලි මාසයේ සිට ක්‍රියාත්මක වේ. අස්වැසුම සුබසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට ඇතුළත් නොවන අනෙකුත් බාහිර ප්‍රතිලාභී දීමනා ලැයිස්තු ඉදිරියේදී ක්‍රමානුකූලව මෙම යෝජනා ක්‍රමයට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව අනෙකුත් සුබසාධක යෝජනා ක්‍රම සඳහා අදාළ කර ගත හැකි පරිදි IWMS පද්ධතිය සංවර්ධනය කිරීම සිදුකරනු ලැබේ.
9.3.3	නිර්ණායක සංඛ්‍යාව අඩු කිරීමෙන් සහ ඉලක්කගත කණ්ඩායම හඳුනා ගැනීම සඳහා මනෝමූලික නිර්ණායක නිවැරදිව භාවිතා කරන බව සහතික කිරීමෙන්, 2024 වර්ෂයේ අස්වැසුම සුබසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ දෙවන ගණනය කිරීම සඳහා වන තෝරා ගැනීමේ ක්‍රියාවලියේ නිර්ණායක (පරාමිතීන්) විධිමත් කිරීම නිර්දේශ කෙරේ.	දැනට නිර්ණායක සංශෝධනය පිළිබඳව තාක්ෂණික කමිටුවක් මඟින් අධ්‍යයනය කරමින් පවතී. එහි නිර්දේශ ලබාගෙන රෙගුලාසි සංශෝධනය කර ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය බැවින් 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර ඇත.

9.3.4	ඒකක 30 ට අඩුවෙන් හෝ ඒකක 60 ට අඩුවෙන් විදුලිය පරිභෝජනය කරන නිවාස පිළිබඳ සලකා බලමින් (ඒකක 60 ට අඩුවෙන් නිර්ණායකය සකස් කර ඇත්නම් සූර්ය පැනල භාවිතය සැලකිල්ලට ගත යුතුයි) දරිද්‍රතාවය තක්සේරු කිරීමේ නිර්ණායකයක් ලෙස විදුලි බිල භාවිත කිරීම නිර්දේශ කෙරේ.	දැනට පත්කර ඇති තාක්ෂණික කමිටුව මඟින් විදුලි පරිභෝජනය, පවුලේ ආදායම හා දේපළ හිමිකාරිත්වය වැනි ප්‍රධාන නිර්ණායක මේ සඳහා යොදා ගැනීමට ඇති හැකියාව පිළිබඳව සාකච්ඡා කර ඇත. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් ඉදිරියේදී සිදු කරනු ලබන ගෘහස්ථ ආදායම් හා වියදම් සමීක්ෂණය මඟින් ලැබෙන තොරතුරු මත නිශ්චිත දර්ශක සීමාවන් ලබාගෙන දරිද්‍රතාවයෙන් පෙළෙන්නන් විධිමත්ව හඳුනා ගැනීමට කටයුතු කරනු ලැබේ.
9.3.5	අනෙකුත් නිර්ණායකවලට සාපේක්ෂව අඩු බරක් පවරන අතරම ආර්ථික මට්ටමේ නිර්ණායකයට වැඩි බරක් පැවරීම සහ මැනිය හැකි සහ අභියෝග කළ නොහැකි නිර්ණායක (පරාමිතීන්) තෝරා ගැනීම නිර්දේශ කෙරේ.	තාක්ෂණික කමිටුව මඟින් මෙම කරුණු සැලකිල්ලට ගෙන ක්‍රියාත්මක කළ යුතු ආකාරය අධ්‍යයනය කරමින් පවතී. ඒ අනුව ඉදිරියේදී සුදුසු පරිදි ක්‍රියාත්මක කිරීමට නියමිතය.
9.3.6	අස්වැසුම ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ දෙවන ගණනය කිරීම ආරම්භ කිරීමට පෙර, තෝරා ගැනීමේ ක්‍රියාවලිය සඳහා භාවිතා කරනු ලබන පරාමිතීන් පිළිබඳ නැවත සලකා බැලීම සහ තෝරාගත් ප්‍රජාවක් තුළ ක්ෂේත්‍ර අත්හදා බැලීමක් සිදු කිරීම නිර්දේශ කෙරේ.	බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තෝරාගත් පවුල් 200ක් පදනම් කරගෙන එවැනි ක්ෂේත්‍ර පරීක්ෂණයක් ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව සිදුකර ඇත. එහි ප්‍රතිඵල මත තවදුරටත් පුළුල් දත්ත පද්ධතියක් යොදාගෙන පරීක්ෂණ සිදුකර පරාමිතීන් සංශෝධනය පිළිබඳව තාක්ෂණික කමිටුව නිර්දේශ ලබා ගෙන ඇත. එම ප්‍රතිඵලය ප්‍රමාණවත් නොවන බැවින් තවදුරටත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්වල වෙසෙන සියලුම පවුල් සාපේක්ෂව පදනම් කරගෙන, පුළුල්ව මෙම ක්ෂේත්‍ර පරීක්ෂාව සිදුකර 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කරනු ලැබේ.
9.3.7	ප්‍රජාවගේ බිම් මට්ටමේ යථාර්ථය හොඳින් හඳුනන ක්ෂේත්‍ර නිලධාරියකුගේ සේවය ලබා ගැනීම නිර්දේශ කෙරේ. සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සුබසාධන කටයුතු සඳහා බඳවා ගැනීම සැලකිල්ලට ගනිමින් ඔවුන් ප්‍රමුඛස්ථානයෙහිලා සැලකිය යුතු අතර සහ ඔවුන්ගේ සේවය ලබාගත නොහැකි නම් ග්‍රාම නිලධාරීන් සේවයට බඳවා ගැනීමේ විකල්පය අනුගමනය කළ යුතුය.	ග්‍රාම නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වැනි එකඟතාව දක්වන සුදුසු ක්ෂේත්‍ර නිලධාරීන් මේ සඳහා මිශ්‍රව සේවයේ යොදා ගැනීමට පියවර ගෙන ඇත.

9.3.8	සමෘද්ධිය අස්වැසුමෙන් වෙන්කර හඳුනා ගැනීම උදෙසා අස්වැසුම පිළිබඳ නිසි දැනුවත් කිරීමේ වැඩසටහන සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලයේ නිලධාරීන් විසින් නිශ්චිත කාල රාමුවක් තුළ සිදු කළ යුතුය.	මේ සඳහා සන්නිවේදන සැලැස්මක් හා උපායමාර්ග සකස්කර ඇති අතර, ඒ අනුව නිසි දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වාගෙන යනු ලැබේ.
9.3.9	විදාතා මධ්‍යස්ථාන සමඟ එක්ව, අස්වැසුම ප්‍රතිලාභ යෝජනා ක්‍රමයෙන් ප්‍රතිලාභ ලබන පුද්ගලයින් ශක්තිමත් කිරීම ඉලක්ක කරගත් ඒකාබද්ධ බලගැන්වීමේ වැඩසටහනක් දියත් කිරීම නිර්දේශ කෙරේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයනු ලබන 'සෞභාග්‍යා' ණය යෝජනා ක්‍රමය ප්‍රයෝජනයට ගැනීම සහ සමෘද්ධි දෙපාර්තමේන්තුවේ සමෘද්ධි බැංකුවල සම්පත් පදනමක් ලෙස උපයෝගී කර ගැනීම මෙම වැඩසටහනට ඇතුළත් වනු ඇත. ප්‍රතිලාභීන් අතර ව්‍යවසායකත්වය දිරි ගැන්වීම සඳහා ප්‍රාග්ධනය, තාක්ෂණය සහ අලෙවිකරණ ප්‍රයත්නයන් ඇතුළත් කිරීම අත්‍යාවශ්‍ය වේ.	මෙම කාර්යභාරය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරා ඇත.
9.3.10	ඵලදායී සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක කිරීම නිර්දේශ කෙරේ.	මේ සඳහා IWMS පද්ධතියේ අඩුපාඩු සමනය කරමින් සංවර්ධනය නොකළ කොටස් සංවර්ධනය කිරීම සඳහා අදාළ සමාගම සමඟ ගිවිසුම්ගතවීමට පියවර ගෙන ඇත. ඉදිරියේදී ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමඟ එක්ව කඩිනම් සමීක්ෂණයක් (rapid survey) එකක් සිදුකර සමාජ ආරක්ෂණ ජාලය තවදුරටත් ඵලදායීව සිදුකිරීමට සැලසුම්කර ඇත.

9.3.11	ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සෑම වසර තුනකට වරක් ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය (HIES) පැවැත්වීම නිර්දේශ කෙරේ. ඒ අනුව, පෙර සමීක්ෂණය 2019 වර්ෂයේදී සිදු කළ බැවින් ඊළඟ ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය 2022 වර්ෂයේදී පැවැත්විය යුතුව තිබුණි.	ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් 2019න් පසුව ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය සිදුකර නැති බැවින්ද, 2024 දී එය සිදු නොකරන බැවින්ද කඩිනම් සමීක්ෂණයක් (rapid survey) සිදු කිරීමට අපේක්ෂා කරන අතර, 2025 වර්ෂයේදී ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය සිදුකිරීමට නියමිතව ඇත.
9.3.12	ග්‍රාම නිලධාරී සේවා ව්‍යවස්ථාව අවසන් කිරීම සම්බන්ධ ගැටළු විසඳීමටත්, 2024 දී ආරම්භ කිරීමට නියමිත අස්වැසුම් සුබසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ දෙවන ගණනය කිරීම සඳහා ග්‍රාම නිලධාරීන්ගේ සහාය ලබා ගැනීමටත් කටයුතු කළ යුතු බවට නිර්දේශ කෙරේ.	සේවා ව්‍යවස්ථාව අවසන් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය කටයුතු කරන අතර දෙවන පියවරේ අස්වැසුම් සුබසාධක වැඩසටහන සඳහා ග්‍රාම නිලධාරීන්ගෙන් කොටසක් පමණක් සහාය ලබා දී ඇත. මෙම විෂයට අදාළව මෙම නිලධාරීන්ට රු.2,500/- ක මාසික දීමනාවක්ද දැනට ගෙවනු ලැබේ.
9.3.13	විමධ්‍යගත අයවැයෙන් සැලකිය යුතු ප්‍රතිපාදන සහිතව ලිපි ද්‍රව්‍ය සහ ඉන්ධන වැනි අයිතම ඇතුළුව සෑම ග්‍රාම නිලධාරි වසමකම විවිධ වියදම් පියවා ගැනීම සඳහා වැඩසටහනක් ආරම්භ කිරීම නිර්දේශ කෙරේ.	මෙය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් සිදුකළ යුතු කාර්යයකි. කෙසේ නමුත් අස්වැසුම් වැඩසටහන ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ග්‍රාම නිලධාරීන්ටද ඇතුළුව පරිපාලන වියදම් සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්ට සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙනු ලැබේ.
9.3.14	අස්වැසුම් ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ දෙවන අදියරයට අදාළව ග්‍රාම නිලධාරීන්ගෙන් අපේක්ෂිත කාර්යය දැක්වෙන රාජකාරි ලැයිස්තුවක් නිර්මාණය කිරීමටත්, අයදුම්කරුගේ ස්වයං-ප්‍රකාශිත තොරතුරුවල වගකීමෙන් ග්‍රාම නිලධාරීන් නිදහස් කිරීම දක්වමින් ග්‍රාම නිලධාරීන් වෙත බලය පැවරීමේ ලිපියක් නිකුත් කිරීමටත්, 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 21 සහ 22 වගන්ති බලාත්මක නොකරන බව සහ අස්වැසුම් ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේදී ග්‍රාම නිලධාරිවරයෙකු විසින් සිදු කරන යම් විෂමාචාරයක් වේ නම් ඒ සම්බන්ධව ආයතන සංග්‍රහයේ සහ මූල්‍ය රෙගුලාසිවල දක්වා ඇති විධිවිධානවලට අනුව කටයුතු කෙරෙනු ඇති බව සහතික කර ගැනීම යෝජනා කෙරේ.	මෙම නිර්දේශ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් සුදුසු පරිදි දැනටමත් ක්‍රියාත්මක කර ඇත.

9.3.15	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව එකිනෙක සම්බන්ධ කරමින් මාර්ගගත ඩිජිටල් වේදිකාවක් නිර්මාණය කිරීම නිර්දේශ කෙරේ.	ඉදිරියේදී අදාළ අමාත්‍යාංශ සමඟ එක්ව මේ සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ.
9.3.16	විශ්‍රාමිකයින්ගේ දුක්ගැනවිලි සහ ගැටළු සාකච්ඡා කිරීම සඳහා සම්බන්ධීකරණය පවත්වා ගැනීමේ කාර්යය වෙනුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු මහජන සම්බන්ධතා නිලධාරියා ලෙස පත් කිරීම සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මහජන සම්බන්ධතා නිලධාරියා විසින් සියලුම විශ්‍රාමිකයින්ගේ සංගම්වල නියෝජිතයින් සමඟ සෑම මාස තුනකටම වරක් රැස්වීමක් පැවැත්වනු ලැබීම නිර්දේශ කෙරේ.	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත මෙම නිර්දේශය යොමු කළ යුතුවේ.
9.3.17	මානුෂීය හේතූන් මත විශ්‍රාමිකයින්ට ජීවන වියදම් දීමනාවක් වශයෙන් සරිලන මුදලක් ලබා දීමටත්, දැනට පවතින ජීවන වියදම් දර්ශකයට සමානුපාතිකව එම ජීවන වියදම් ගැලපීම සඳහා සූත්‍රයක් සැකසීම නිර්දේශ කෙරේ.	රාජ්‍ය මූල්‍ය අවකාශය තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ හැකියාව සම්බන්ධයෙන් අධ්‍යයනය කළ යුතුවේ.
9.3.18	2016.01.01 දිනට පෙර රජයේ සේවයෙන් විශ්‍රාම ගන්වනු ලැබූ විශ්‍රාමිකයින්ට අග්‍රහාර ප්‍රතිලාභ ලබාදීමේ හැකියාව පිළිබඳ සොයා බැලීම නිර්දේශ කෙරේ.	
9.3.19	ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා පොළිය 9% දක්වා වැඩි කිරීම නිර්දේශ කෙරේ.	මෙම සහනාධාරය ලබා දීම සම්බන්ධයෙන් පවතින මූල්‍ය සීමා අනුව ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතු අතර, බැංකු පද්ධතිය විසින් මේ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ.

9.3.20	රජයේ බැංකු (මහජන බැංකුව සහ ලංකා බැංකුව) මඟින් වැඩිහිටි දීමනාව ගෙවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම නිර්දේශ කෙරේ.	බැංකු ගිණුම් මාර්ගයෙන් ගෙවීමට පියවර ගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන්ට දැනටමත් දන්වා ඇත.
9.3.21	අස්වැසුම ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ සකස් කරන ලද සමාජ ප්‍රතිලාභ ලැබිය යුතු පුද්ගලයින්ගේ ලැයිස්තුවට (Social Registry) ආබාධිත හා වැඩිහිටි දීමනා ලබන ප්‍රතිලාභීන් ඇතුළත් කිරීම නිර්දේශ කෙරේ.	අනුමත සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය අනුව මෙම පුද්ගලයින් ක්‍රමයෙන් ඇතුළත් කිරීමට පියවර ගනු ලැබේ.
9.3.22	ග්‍රාමීය මට්ටමින් දේශීය නිෂ්පාදකයින්ගේ සැපයුම් දාමයක් නිර්මාණය කරමින් සිසුන්ට දිවා ආහාරය ලබාදීමේ වැඩසටහනක් පාසල් මට්ටමින් දියත් කිරීම නිර්දේශ කෙරේ.	මෙම නිර්දේශය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කළ යුතු වේ.

.....

රනිල් වික්‍රමසිංහ

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය